# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 6,928 — 1918ක්වූ මාර්තු මස 8වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

---

### ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් කරණලද ප්‍රකාශපත්‍රයයි.

වර්‍ෂ 1907 නොතාරිස් ආඥාපණත.

වර්‍ෂ 1907 නොතාරිස් ආඥාපණතේ 30වෙනි කාණ්ඩයෙන් පවරණලද බලය කරණකොටගෙණ කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් මෙහි පහත දක්වන නියෝගය පණවා වදාළ බව මෙයින් දන්වනු ලැබේ.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,

වර්‍ෂ 1918ක්වූ පෙබරවාරි මස 23වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය. ——— ආර්. ඊ. ස්ටබ්ස්, මහලේකම්තාරිස් වහ්ග.

එකී නියෝගය.

වර්‍ෂ 1917තේ නොම්මර 9යේ ආඥාපණතේ 113 (3) කාණ්ඩය යටතේ භාරකාරයෙක් පත්කෙරීමේ සිහිවීම්පතක් යම් නොතාරිස් කෙනෙක් ඉදිරියේ ලියන්ට යෙදුනේවීනම් ඔහු විසින් මෙහි පහත දක්වන ෆෝර්මයේ හැටියට තොරතුරු සඳහන් සිහිවීම්පතක් තමන් පදිංචි පලාතේ ඉඩම් ලියාපදිංචිකරණ රිජිස්ත්‍රාර්තැන වෙත වහාම යවන්ට ඕනෑය.

භාර දේපල හෝ එයින් කොටසක්වත් වෙන පලාතක පිහිටාතිබේනම් ඒ පලාතේ ඉඩම් ලියාපදිංචිකරණ රිජිස්ත්‍රාර් තැන වෙතත් එසේම කෙටුම්පතක් යවන්ට ඕනෑය.

ක්‍රමය.

වර්‍ෂ 1917 නොම්මර 9යේ ආඥාපණතේ 113වෙනි වගන්තියේ ප්‍රකාර පුණ්‍යදායක භාරකාරත්වයක් සම්බන්ධව නොහොත් සමාගමක් සම්බන්ධව භාරකාරයෙක් පත්කෙරීමේ සිහිවීම්පත් හා ඒ පිළිබඳ තොරතුරු.

1. පුණ්‍යදායක භාරකාරත්වයේ හෝ සමාගමේ නම.
2. පත්වීම කරණලද බලය ගැන තොරතුරු—(භාරකාරකමේ ලියවිල්ලක් හෝ ආඥාපණතක් පිටද හෝ සිරිතක් වශයෙන්ද යන වග.) භාරකාර ලියවිල්ලක්පිටනම් එම ලියවිල්ලේ ස්වභාවද දිනම සහ තොරතුරුද.
3. අළුතෙන් පත්කරණලද භාරකාරතැනගේ නම සහ පදිංචි ස්ථානය.
4. පුරප්පාඩුවූ ප්‍රථම භාරකාරතැනගේ නම සහ පදිංචි ස්ථානය.
5. පත්වීමේ සිහිවීම්පත්‍රයේ නොම්මරය සහ දිනම.
6. සහතිකකරණලද නොතාරිස්තැනගේ නම.
7. භාරකාර දේපලවල තොරතුරු.

සැලකිය යුතුයි.—භාරකාරත්වයේ දෙය, නිශ්චල දේපලවීනම්, එය පිහිටාතිබෙන ගමද, පත්තුවද, කෝරලේද, පලාතද, නගරයද, හැකිපමනින් එක එක කාණ්ඩය සම්බන්ධව පෙන්වාදිය යුතුය. තොරතුරු දීර්ඝලෙස කියනොහැකි නම් භාරකාර දේපල සාමාන්‍යයෙන් පිහිටි ස්ථානය පෙන්වාදිය යුතුයි.

අත්සන්කලේ, ———
සහතිකකරණලද නොතාරිස්තැන.

---

### උපාධිශනීති.

මීනුවන්ගොඩ නගරශිවෘද්ධික සභාව විසින් වර්‍ෂ 1898වේ නොම්මර 13තේ රෙකුලාසියේ 56වෙනි වගන්තියේ 5වෙනි උපවගන්තිය යටතේ මෙහි පහත සඳහන් අතුරුපණත් කාරක මන්ත්‍රණ සභාවේ කැමැත්ත පිට ලංකාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් ස්ථිරකරනලදින් පොදු ජනයාගේ දැනගැණීම පිණිස මෙයින් ප්‍රසිද්ධකරන්ට යෙදුනා ඇත.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,

වර්‍ෂ 1918ක්වූ මාර්තු මස 4වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය. ——— ආර්. ඊ. ස්ටබ්ස්, මහලේකම්තාරිස් වහ්ග.

පාන් ගෙවල්.

1. පාන්ගෙය යන්නෙන් මනුෂ්‍යයාගේ ආහාරය පිණිස විකිණීමට පාන්, විස්කෝත්තු හෝ පැණිරස කෑම සාදන්නාවූ ඕනෑම ස්ථානයක් හඟවයි. තවද එබඳු ආහාර සෑදීමට සූදානම්කරණලබන හෝ එබඳු ආහාර සූදානම්කිරීමට උවමනා ද්‍රව්‍යයන් රැස්කර තබන්නාවූද කොයිම ස්ථානයක් වුවත් ඊට අන්තර්ගතවේ.

2. සභාපතිතැනගෙන් අවුරුදුපතා ගන්නාලද බලපත්‍රයක් නොමැතිව කිසිවෙකුට පාන්ගෙයක් තබන්ට බැරිය. එම බලපත්‍රය එහි අන්තිම දිනය වන දෙසැම්බර් මස 31වෙනි දින දක්වා හෝ එම බලපත්‍රය අවලංගුකරණලබනතුරු

පාවිච්චිකළ හැකිය. මේ අණපණත්වලට අනුව ක්‍රියාකිරීම අතපසුකරණ කාටනුමුත් එම බලපත්‍රය දීම ප්‍රතික්ෂෙපකිරීමට සභාපතිතැන පිට බලය පවරනලදී. එවැනි බලපත්‍රය මන්ත්‍රණ සභාගත ආණ්ඩුකාරතැනගේ කැමැත්ත ඇතුව මිනුවන්ගොඩ ලෝකල් බෝඩ් සභාව විසින් අරමුණුකරණු ලබන ගාස්තු ගෙවීමට වැඩිදුරටත් බැඳීතිබේ.

3. යම් කෙනෙක් යම් උසාවියක් විසින් දෙවතාවක් හෝ ඊට වැඩි වාරගණනක් මේ අණපණත් කඩකිරීම ගැණ දඬුවම් කරණුලබන්නේනම් එබඳු දෙවෙනි නඩුව ලියාතබන උසාවිය විසින් මේ පරිච්ඡෙදය යටතේ මිනුවන්ගොඩ "ලෝකල් බෝඩ්" සභාපතිතැන විසින් ඒ අයට නිකුත්කරණලද එවැනි බලපත්‍රය අවලංගුකිරීම ව්‍යවස්ථානුකූලවේ. උසාවිය විසින් බලපත්‍රයක් එසේ අවලංගුකරණු ලැබූවිට එම අයට යම්කිසි අභිනව බලපත්‍රයක් නිකුත්කිරීම සභාපතිතැනගේ කැමැත්තේ ප්‍රකාර ප්‍රතික්ෂෙපකිරීමට මිනුවන්ගොඩ ලෝකල් බෝඩ් සමිතියේ සභාපතිතැනට මෙයින් බලය දෙනලදී.

4. පාන්පිටි අනන කාමරය ඉතාම අඩුගණනේ පළල අඩි 12ක් සහ දිග අඩි 15කින් සම්පූර්ණවිය යුතුයි. පූරම වාතාශ්‍රය ඇතිවීම පිණිස අඩුගණනේ දෙපැත්තකින්වත් පළල අඩි 7ට අඩුනොවන අවකාස ස්ථාන පිටතින් ඇතිවිය යුතුයි. පෝරනුවේ දොර පිටි අනන කාමරය කෙලින් නොදැමියයුතුයි. සෑම පිටි අනන කාමරයකටම උඩුවියනක් (සීලිං) ඇතිවිය යුතුයි.

5. සෑම පාන්ගෙයටම වාතාශ්‍රය සහ ආලෝකය යහපත්සේ තැබිය යුතුයි. සෑම කොටසේම භිත්ති උස අඩි 7කින් අඩු නොව ගඩොල්, ගල් හෝ කබුක්වලින් බැඳියයුතුයි. එහි ඇතුල හුණෙන් කපරාරුකර හය මාසයකට වරක් සුදුහුණු ගෑයුතුයි. වහලය බොහෝ කාලයක් පවතින ද්‍රව්‍යයකින් සෑදිය යුතුයි. සිලිම අවුරුද්දකට හතර සැරයක් බැගින් කපරාරුකර සුදුහුනු ගෑයුතුයි. නැතහොත් එය වාර්නිස්කරපු හෝ තීන්ත ගානලද ලෑලි ඉතා කිට්ටුවෙන් වද්දවා සෑදීමට පුළුවන. ගෙබිම සෑම තැන්හි සිමෙන්ති දමා සෑහෙන පමණ කාණුවලින් යුක්තවිය යුතුයි. ඇරීමට හැකිවූද ගෙබිමේ ප්‍රමාණයෙන් දහසයෙන් පංගුවකට අඩුනොවන සම්පූර්ණ විශාලකමක් ඇතිවූද ජනේල සෑම කාමරයකම තැබිය යුතුයි.

6. පාන් සහ කැවිලි සාදන්ට පාවිච්චිකරණ සියලුම භාජණ ඉතාම පිරිසිදුව තිබිය යුතුයි. තවද ඒවා ගෙබිම සුඛ කරණවිට ඉවත්කිරීමටද හැකිවිය යුතුයි.

7. අඩුගණනේ පැය විසිහතරකට වරක් බැගින්වත් ගෙබිම පරීක්ෂා සහිතව සූර අතුගෑම කළයුතුයි. තවද එම කුණුකසළ දියකාන්දු නොවන වසනලද භාජනයකට එම ඇසිල්ලේම දමා දිනපතා පාන් ගෙයින් පිටතට ගෙණයා යුතුයි.

8. සෑම පාන්ගෙයම පිරිසිදු අන්දමේ තැබිය යුතුයි. තවද කානු, වැසිකිළි හෝ අනිකුත් කුණු කසළින් නැගෙණ අශුබ වාතයෙන් තොරවිය යුතුයි.

9. කිසිම පාන්ගෙයක් වැසිකිළියකින් හෝ පෝර ගොඩකින් හෝ ඇර තිබෙන කුණු වළකින් අඩි 50ක් ඇතුළත නොතැබිය යුතුයි.

10. පාන් සෑදීමට ඕනෑකරණ දේවල් හැර වෙන කිසිම බඩුවක් හෝ ද්‍රව්‍යයක් පාන්ගෙය තුළ නොතැබිය යුතුයි.

11. මේසවල මුදුන් හොඳකාර මෝරපු කිට්ටුකර වද්දනලද ලෑලිවලින් හෝ අනතුරය රහිත දියකාන්දු නොවන වෙනයම් ද්‍රව්‍යයකින් හෝ සෑදිය යුතුයි. තවද ඒවා දිනපතා සූර ශුබ කළ යුතුයි.

12. කොයිම කාරණයක් හේතුකොටගෙණ කිසිම සතෙක් පාන්ගෙයක තබා නොගත යුතුයි.

13. බෝවෙන රෝගයකින් පෙළෙන්නාවූ හෝ පාන් ගෙයක් භාරකාරයා දැනුවත්ව බෝවෙන රෝගයකින් ළඟදීම පෙළිසිටියාවූ හෝ එවැනි රෝගයකින් පෙළෙන අයකුට සාත්තුකිරීමෙහි ළඟදී යෙදී සිටියාවූ කෙනෙකුට පාන්ගෙයට ඇතුල්වීමට හෝ එම පාන් සෑදීමට හෝ එහි අයවට විකිණීමට එම පාන්ගෙය භාරකාරයා විසින් නොයෙදිය යුතුයි.

14. පාන් සෑදීමේ හෝ පිලිස්සීමේ යෙදී සිටින සියලුදෙනාම පාන් සෑදීම පටන්ගන්ට පෙර අත් සෝදාගෙණ පසුව සහ ශරීරය වැසෙන අන්දමේ පිරිසිදුවූ සුදු වැස්මක් සහ සුදු කැප් එකක් හෝ තලප්පාවක් ඇන්ද යුතුයි.

15. පාන් විස්කෝතු සහ රසකැවිලි සෑදීමෙහි යෙදී සිටින්නන්ගේ පාවිච්චියට හොඳ වතුර සහ සබන් සපයා තැබිය යුතුයි.

16. විකිණීමට තබනුලබන සියලුම පාන් විස්කෝතු සහ රසකැවිලි ජනී මැස්සන්ට ඇතුල්වෙන්ට නුපුළුවන් තිසිලෙස සාදනලද විදුරු පෙට්ටිවල තැබිය යුතුයි. පෙට්ටි ඉතාම පිරිසිදුව තැබිය යුතුයි.

17. පාන් සෑදීමට ගන්නා පිටි වතුර සහ අනිත් ද්‍රව්‍යයන් යහපත් ඒවා වියයුතුයි. තවද බිමෙන් අඩි 3ක් උස්කොට සාදනලද උස් ස්ථානයක පිටි තැබිය යුතුයි.

18. පාන් පුළුස්සන ගෙවල්වලට අයිති මිදුල්වල තිබෙන කසල සියල්ලම දිනපතා ඉවත්කළ යුතුයි. කාණුද හොඳකාර වතුර ගසා සේදිය යුතුයි.

19. පාන්ගෙයි මට්ටමට ඇත්තාවූද එම ගොඩනැගිල්ලේ කොටසක් වන්නාවූද කිසිම ස්ථානයක බිමේ පටන් සිලිම දක්වා පැතිර තිබෙන ක්‍රමයකින් පාන්ගෙයින් හරියාකාර වෙන්කර නැත්නම් එය නිදාගැනීමට පාවිච්චි නොකළ යුතුයි. මූත්‍රා කොටුවක් හෝ වැසිකිළියක් හෝ අලුවළක් පාන්ගෙය ඇතුළේ හෝ ඊට සම්බන්ධකර හෝ නොතැබිය යුතුයි.

20. සෑම සුදුසු වේලාවලටද පාන් පිලිස්සීම කරන්නාවූ ඕනෑම විටකද පාන්ගෙට හෝ පාන් විකිණීමට තබා තිබෙන්නාවූ ස්ථානයට ඇතුල්ව මිනුවන්ගොඩ ලෝකල් බෝඩ් සමිතියේ පරීක්ෂකතැන විසින් හෝ සභාපතිතැන විසින් ලියවිල්ලකින් බලය දෙනලද වෙන කෙනෙකු විසින් හෝ පරීක්ෂාකිරීමට නීතියේ ආකාර බලය තිබේ.

21. මේ අණපණත්වල පිටපතක් රාමුවක දමා සෑම පාන්ගෙවලම හොඳින් පෙනෙන ස්ථානයක එල්ලා තැබිය යුතුයි.

---

## ඉඩම් විකිණීම්.

**No. 3,121, S. P.**—දකුණු දිසාවේ මාතර උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වෂී 1918ක්වූ අප්‍රේල් මස 26වෙනි දිනවූ සිකුරාදා සවස 2ට මාතර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ මාතර පලාතේ වැල්ලබඩපත්තුවේ සහ ගඟබඩපත්තුවේ පිහිටා තිබෙන බිම්කැබලි 12ක්.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| | සිතියම 10,750. ගම—දන්දෙනිය. අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | |
| 1 | උලුපට්ටලේහේන .. | .. ගුනවර්ධන මහත්මයා | පැගිරි | .. 3 0 33 | 40 |
| | සිතියම 10,751. ගම—පරවාහැර. | | | | |
| 1 | මුත්තේට්ටුආරේදෙනිය .. | .. ලවෝනිස්අප්පු | .. වත්ත | .. 0 1 35 | 100 |
| | සිතියම 10,763. ගම—වලකන්ද. | | | | |
| 1 | පුස්වැල්කුඹුරේඅත්මග .. | .. බාලඅප්පු | .. බැද්ද | .. 1 0 3 | 60 |
| 2 | ගල්වලගාවාබැද්ද නොහොත් කොටුපලගාවාදෙනිය | — | .. එම | .. 0 3 19 | 60 |
| 3 | එම .. | .. — | .. පාරට අත්ඇරපු හරිය | 0 0 27 | —* |
| 4 | එම .. | .. බාලඅප්පු | .. පැගිරි | .. 4 3 16 | 50 |

* විකුණන්නේ නැහැ.

සිතියම 10,729. ගම—වලකන්ද. අයිතිකමකියන්නා—වී. ජී. බබුන්හාමි.

| නො. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා. | අන්දම | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | ආරේහේන නොහොත් දෙළපහලවත්ත | ආණ්ඩුව | වත්ත | 1 0 0 | 50 |
| 2 | එම | එම | එම | 0 1 16 | 50 |
| 3 | පුන්චිඅඹහේන නොහොත් දෙළපහලවත්ත | එම | එම | 0 2 8 | 50 |
| 4 | ගොඩැල්ලේහේන | එම | එම | 0 3 7 | 60 |
| 5 | අඹගහහේන නොහොත් රනරලගේවත්ත | එම | එම | 0 2 9 | 50 |
| 6 | එම | එම | එම | 3 2 33 | 50 |

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරනා මාතර උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1918ක්වූ මාර්තු 1වෙනි දින කොළඹ
මහලේකම්තුමාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තුමාරිස් වෙනුවට.

---

**No. 1,252, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ අප්‍රේල් මස 30වෙනි දිනවූ අඟහරුවාදා දවල් 12ට බදුළු කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් නින්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ උඩුකිඳ සහ බුත්තල පලාතේ පිහිටා තිබෙන බිම්කැබලි 35ක්.

අන්තිම සිතියම 26. ගම—උඩුකිඳ මහපලාතකෝරළේ ඇත්තලපිටියේගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 49*f* | ඇකුළුආගොඩපතන | ඩබ්ලිව්. ඇම්. කිරිවන්තේ | පතන | 1 1 11 | 45 |
| 3*z* | ගොඩවැවේපතන | සී. ජේ. ඇස්. සෙනෙවිරත්න | එම | 10 2 18 | 50 |
| 63*ba* | ගොඩවැවපතන | එම | එම | 0 0 14 | 50 |

සිතියම 1,986. ගම—බන්ඩාරවෙල ලෝකල්බෝඩ් මායිම් ඇතුළුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | අගතඅරුවේපතන | — | පතන, ගෙයක්සහ එහියෑමට පාරක් තිබේ. මෙම ඉඩම සහ ගෙය ගව දෙස්තරට නැවතිම පිණිස වුව මනාකර තිබේ | 0 1 8·3 | —* |

සිතියම 1,948. ගම—බුත්තල පලාතේ බුත්තලකෝරළේ ඔක්කම්පිටියේගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | වනේයාය නොහොත් කොලොන්ගස්වත්ත | කොලොන්ගස්වත්තේ හුඳුඅප්පු | හේන, කෙසෙල්ගස් ස්වල්පයක්ද, ගෙයක්ද තිබේ | 1 0 34 | 15† |

සිතියම 1,949. ගම—බුත්තලපලාතේ බුත්තලකෝරළේ ඔක්කම්පිටියේගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | වනේයාය | — | කැලෑව, ඇලට ඉතුරුකර තිබේ | 0 0 33 | —* |
| 2 | එම | බාලහාමි | කැලෑව | 1 0 6 | 15† |
| 3 | එම | ආර්. ඇම්. තිසාහාමි | එම | 0 3 34 | 15† |

අන්තිම සිතියම 78. ගම—බුත්තලකෝරළේ බටුගම්මනගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 3*t* | මැදඅරුවේහේන | ඒ. බී. ඇම්. ගංඇති | හේන | 1 0 4 | 25 |
| 3*r* | එම | — | හේන ගම්සභා පාරට ඉතුරුකර තිබේ | 0 0 20 | —* |
| 3*u* | එම | — | හේන ආරට ඉතුරුකර තිබේ | 1 0 16 | —* |

සිතියම 1,938. ගම—උඩුකිඳ උඩපලාතකෝරළේ හරක්ගමකන්දගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | පල්ලියගොඩපතන | (1) ඞී. ඇන්. ජයවර්ධන, (2) මුදුම්පිට ඩබ්ලිව්. ඇම්. අප්පුහාමි සහ (3) ගලහිටියාවේ ගෙදර ඇම්. ඇම්. සියාතු ගමරාල | පතන | 2 2 22 | 50 |
| 2 | එම | — | පතන, කොඩිකනුවට ඉතුරුකර තිබේ | 0 2 11 | —* |

ආණ්ඩුවේ ඉඩම, ඞී. ඇන්. ජයවර්ධන විසින් අල්ලාගන තිබේ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 3 | හුනුකොටුවේවත්ත | — | එලවළුවත්ත | 0 0 8 | 60 |

අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 4 | පල්ලියගොඩවත්ත | — | පතන, පාරට ඉතුරුකර තිබේ, | 0 0 16 | —* |
| 5 | එම | — | පතන, පී. ඩබ්ලිව්. ඞී, කුලීකාරයින්ගේ ගෙවල් තිබේ | 0 0 29 | —* |

ආණ්ඩුවේ ඉඩම, ඞී. ඇන්. ජයවර්ධන විසින් අල්ලාගන තිබේ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 6 | අඹගහකොටුවේවත්ත | — | එලවළුවත්ත කඩයක්ද තිබේ | 0 0 20 | —* |

අන්තිම සිතියම 257. ගම—බුත්තල පලාතේ බුත්තල කෝරළේ කටුගහගල්ගේගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 8*d* | කන්දියවත්ත | මැදගෙදර අප්පුහාමි | හේන | 1 0 17 | 20‡ |
| 8*e* | හුනුකැටියේහේන | හෙලගෙදර පුංචිරාල | එම | 1 0 4 | 20‡ |
| 8*f* | අල්පිටියේහේන | පොකුනේගෙදර තිසාහාමි | එම | 1 0 2 | 20‡ |
| 8*g* | එම | මැදගෙදර ඞී. ඇම්. උක්කුබන්ඩා | එම | 1 0 4 | 20‡ |
| 8*h* | එම | මැදගෙදර අප්පුහාමි | එම | 1 0 3 | 20‡ |
| 8*i* | එම | හෙලගෙදර කිරිවන්තේ | එම | 1 0 3 | 20‡ |
| 8*j* | එම | අළුත්ගෙදර කිරිවන්තේ | එම | 1 0 2 | 20‡ |
| 8*k* | එම | පහලගෙදර තිසාහාමි | එම | 1 3 39 | 20‡ |
| 8*l* | එම | මැදගෙදර හීන්රාල | එම | 1 0 3 | 20‡ |
| 6*m* | එම | පහලගෙදර මුදලිහාමි | එම | 2 0 5 | 20‡ |
| 8*n* | එම | අළුත්ගෙදර පුංචිරාල | එම | 1 0 1 | 20‡ |

* නොවිකුණ ඉතුරුකරනු ලැබේ.

† මෙම ඉඩම් ඔක්කම්පිටියේ ගොවිකම්මානත රෙකුලාසියට යටත්ව අක්කරයකට අවුරුද්දකට දියබද්ද රුපියල් 2ක බැගින් අයකෙරීමට හේතුව ඉල්ලම්කාරයින්ටම විකුණනු ලැබේ. මෙම දියබද්ද අඩු වැඩිකරන්ට හේතුවෙන්ට පුළුවන.

‡ දෙවෙනි වතාවට විකිණීමට ප්‍රසිඩකළා ඇත.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| | මුල් සිතියම 1,956. ගම—බුත්තලපළාතේ බුත්තලකෝරළේ කිඹුලාවෙලගම. | | | | |
| 1 | තුන්ගල්ලන්ද | — | හේන, පාරට ඉතුරුකර තිබේ | 0 0 31 | —* |
| 3 | එම | — | එම | 0 1 22 | —* |
| 4 | එම | පංගුවේගෙදර තිසාහාමි | හේන | 0 1 38 | 30 |
| 5 | එම | පංගුවේගෙදර මුදලිහාමි | එම | 1 0 6 | 30 |
| | අයිතිකමකියන්නා—ආණ්ඩුවේ ඉඩම, ඉල්ලුම්කාරයා විසින් අල්ලාගෙන තිබේ. | | | | |
| 6 | එම | පංගුවේගෙදර හුදුඅප්පු | හේන, කෙසෙල්ගස්ද, මීගස්ද, උළු සෙවිලිකරපු ගෙයක්ද තිබේ | 1 0 6 | 30 |
| | බී. ඈස්. පී. පී. සිතියම 70. ගම—උඩුකිද දඹවිනිපළාත කෝරළේ කරගස්තැන්නේගම. | | | | |
| | අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | |
| 2g | මොටදිඹුලේකැන්න | ලෝවෙන්නා නූර් මහම්මදු | පතන සහ සිහින් කැලේ | 0 3 30 | 30 |
| 2h | එම | — | පතන, කුඹුරුවල ආධාරයට ඉතුරු කර තිබේ | 0 2 38 | —* |

* නොවිකුණා ඉතුරුකරනු ලැබේ.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණා ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිය.

වර්ෂ 1918ක්වූ මාර්තු මස 6වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

**No. 4,521, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ අප්‍රේල් මස 27වෙනි දිනවූ සෙනසුරාදා පස්වරු 1ට පිරකැටියේ කුඩාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ හම්බන්තොට පලාතේ බස්නාහිර ගිරුවාපත්තු කොඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 19ක්.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| | ලංකාමැනීමේ සිතියම 372. ගම—ගෝනාදෙනිය. | | | |
| 28dj | කෙලඹුගහවත්ත | ආණ්ඩුව, ජසින්පතිරනගේ දොන් එලියස් විසින් ඉල්ලුම්කර තිබේ | හේන | 1 0 10 |
| 28br | තන්කනත්තේකෝන් ගහහේන | ආණ්ඩුව, අබ්දුල් මරික්කාර් මොහමදු ඊබ්‍රහිම් විසින් ඉල්ලුම්කර තිබේ | එම | 1 1 2 |
| 28bx | කෝන්ගහගේන | ආණ්ඩුව, පෙරුමාල් සින්නසාමි විසින් ඉල්ලුම්කර තිබේ | එම | 1 0 27 |
| 28ci | වලගාවහේන | ආණ්ඩුව, ගලගමරාලලාගේ දොන් හෙන්ද්‍රික් අප්පුහාමි විසින් ඉල්ලුම්කරතිබේ | එම | 0 1 9 |
| 28cn | සේරුගහහේන | ආණ්ඩුව, එම අය විසින් ඉල්ලුම්කර තිබේ | එම | 0 3 36 |
| 28cp | එම | ආණ්ඩුව, පන්ගන්විල සුමනතිස්සතෙරුන්නාන්සේ විසින් ඉල්ලුම්කරතිබේ | එම | 2 0 12 |
| 28cs | වරායහේන | ආණ්ඩුව, ගලගමරාලගේ දොන් හෙන්ද්‍රික් අප්පුහාමි විසින් ඉල්ලුම්කරතිබේ | එම | 2 0 26 |
| 28cu | සේරුගහහේන | ආණ්ඩුව, යක්දූලිගේ සීනා විසින් ඉල්ලුම්කර තිබේ | එම | 1 0 10 |
| 28cv | එම | ආණ්ඩුව, චාර්ලිස් දහනායක විසින් ඉල්ලුම්කර තිබේ | එම | 1 0 12 |
| 28bv | වැවගාවවත්ත | ආණ්ඩුව, සමරසින්පතිරනගේ සඩුන්හාමි විසින් ඉල්ලුම්කර තිබේ | එම | 0 2 19 |
| 28cf | මයිලගහහේන | ආණ්ඩුව, වීරකෝන්ගම්ආච්චිගේ සියදොරිස් විසින් ඉල්ලුම්කර තිබේ | එම | 1 0 8 |
| 28dd | දන්ගහහේන | ආණ්ඩුව, ගලගමරාලලාගේ දොන් හෙන්ද්‍රික් අප්පුහාමි විසින් ඉල්ලුම්කර තිබේ | එම | 2 0 18 |
| 28dk | අඹුනගාවහේන | ආණ්ඩුව, තිස්සකුට්ටිගේ දිනෙස්හාමි විසින් ඉල්ලුම්කර තිබේ | එම | 1 0 1 |
| 28dl | මයිලගහහේන | ආණ්ඩුව, වීරප්පුලිගේ බබප්පුවා විසින් ඉල්ලුම්කර තිබේ | එම | 1 0 6 |
| 28dm | එම | ආණ්ඩුව, වීරප්පුලිගේ බබා අප්පුවා විසින් ඉල්ලුම්කර තිබේ | එම | 1 0 3 |
| 28do | නුගහේන | ආණ්ඩුව, හෙට්ටිආරච්චිගේ දොන් මතෙස් විසින් ඉල්ලුම්කර තිබේ | එම | 1 0 13 |
| 28dp | මයිලගහකොරටුව | ආණ්ඩුව, තිස්සකුට්ටිගේ අන්ද්‍රිස් විසින් ඉල්ලුම්කර තිබේ | එම | 1 3 39 |
| 28dq | තිඹුල්වලහේන | ආණ්ඩුව, තිස්සකුට්ටිගේ දාවිත් විසින් ඉල්ලුම්කර තිබේ | එම | 0 3 38 |
| 28dw | පාළුවත්තහේන | ආණ්ඩුව, කන්කානන්ගමගේ කිරිඅප්පු විසින් ඉල්ලුම්කර තිබේ | එම | 1 0 21 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් තුමාගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1918ක්වූ මාර්තු මස 6වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැණීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—නරවැල්පිට සෙකොලයට පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| | සිතියම 188. ගම—කන්දබොඩපත්තුවේ නරවැල්පිට. | | | |
| 236a | මලපලාවත්ත | වත්ත | වැස්ලියන් මැතොඩිස්ට් සමාගම | 0 1 21·05 |
| 240 | එම | එම | එම | 0 1 36·30 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1918ක්වූ අප්‍රේල් මස 17වෙනි දින දවල් 11යේ කනිසමට මාතර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1918ක්වූ මාර්තු මස 2වෙනි දින මාතර කච්චේරියේදීය.

ටී. රීඩ්.
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—ප්‍රසිද්ධ පිරිමි සවභාෂා පාඨශාලාවක් ගොඩනැගීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රී සභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩම් නම්:—

සිතියම 6,825. ගම—සන්ගිලිපාලම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ඇලමල්කුඹුර නොහොත් පරන්කුඹුර නොහොත් කුටපිටගොඩලියද්ද .. | වත්ත .. | කේ. බී. වෙලගෙදර රටේමහත්මයා .. | 0 1 37·50 |
| 2 | හකුරුඅඹෙකොටුවේවත්ත නොහොත් හපුගහතැන්නේවත්ත .. | එම .. | එච්. බබාහාමිනේ සහ එච්. බෙවෝ අප්පුහාමි .. | 0 1 34·78 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1918ක්වූ අප්‍රේල් මස 20වෙනි දින උදේ 10 කනිසමට නුවරඑළියේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමින ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1918ක්වූ මාර්තු මස 1වෙනි දින නුවරඑළියේ කච්චේරියේදීය.

ඇම්. ඇම්. වැඩර්බර්න්,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්‍ග.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—මුහුදේ ප්‍රවේසමට ඉතුරුකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රී සභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියම 5,283. ගම—පුදුක්කුඩිසිරුප්පු

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කිරිත්තෝනාකඩල් කරෙයිබූමි හෙවත් කිරන්කුලතෝනාබූමි.. | කැලෑව සහ එළිමහන් ඉඩම .. | ඊ. ජේ. බිරිග්ස් මහත්මයා | 4 0 9 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1918ක්වූ අප්‍රේල් මස 11වෙනි දින 1.30 කනිසමට මඩකලපු කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1918ක්වූ පෙබරවාරි මස 26වෙනි දින මඩකලපු කච්චේරියේදීය.

ආර්. ඒ. ජී. පැස්ට්ං,
නැ. දි. ආණ්ඩුවේ ඒජන්ත වර්‍ග

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—මඩකලපු දිස්ත්‍රික්කේ පට්ටිපලආරුවේ පිටවානේ නියරේ ප්‍රවේසමට ඉතුරුකරහැරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියම 5,288. ගම—මලුක්කම්පිටිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පට්ටම්පුට්ටිපල්ලම .. | කුඹුර .. | .. ආදම්පිල්ලේ මෙයදීන් ලෙව්වේ .. | 4 1 26·4 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1918ක්වූ අප්‍රේල් මස 11වෙනි දින 1.30ගේ කනිසමට මඩකලපු කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1918ක්වූ පෙබරවාරි මස 27වෙනි දින මඩකලපු කච්චේරියේදීය.

ආර්. ඒ. ජී. පැස්ට්ං,
නැ. දි. ආණ්ඩුවේ උපඒජන්ත වර්‍ග.

---

## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

[කළුතර දැන්වීම නො. 6,784.]

වර්ෂ 1918ක්වූ මාර්තු මස 8වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයවල් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඇන්. ඒ. හැම්ප්ටන් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එහි කොටසකට කිසි අයිතිකමක් පෙන්වා සිටින්ට නොයෙදුනොත් එකී විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඇන්. ඒ. හැම්ප්ටන්,
විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

ඉඩමේ තොරතුරු.

බස්නාහිර දිසාවේ කළුතර දිස්ත්‍රික්කේ බස්නාහිර පස්දුන්කෝරළේ වලල්ලාවිටිපත්තුවේ කටදෙර යන ගම පිහිටා තිබෙන මිට අමුනාපු සිතියමේ* පෙනියන 94 මුල් සිතියමේ 1Dන් පෙනෙන රූඩ්ස් 3කුත් පර්චස් 16ක් බිම්තරම ඇති සාමාන්‍ය වශයෙන් පත්විලගේනේ පහලදෙනිය කියන නොහොත් ඒ නමින් දැනගෙන තිබෙන බිම්කට්ටියට මායිම්:—උතුරට 138,629 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩමද; නැගෙණහිරට සහ දකුණට ආණ්ඩුව විසින් අයිතිකම්කියන පනියල්මූකලානද; බස්නාහිරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන පුන්චිගුලහකන්දද.

* ඉංග්‍රිසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 393වෙනි පිටේ ප්ලෑනය බලනු.

[කළුතර වි. ම. 4—1918.]

[කුරුණෑගල දැන්වීම නො. 6,785.]

වර්‍ෂ 1918ක්වූ මාර්තු මස 8වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයෙක් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්‍ෂ 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඇන්. ඒ. හැම්ප්ටන් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එහි කොටසකට අයිතිකම පෙන්වා සිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත් වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඇන්. ඒ. හැම්ප්ටන්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

ඉඩමේ තොරතුරු.

වයඹ දිසාවේ කුරුනෑගල දිස්ත්‍රික්කේ දඹදෙනි හත්පත්තුවේ බස්නාහිර උඩුකහකෝරලේ අතුරුවල යන ගම පිහිටා තිබෙන මිට අමුනාපු සිතියමේ* පෙනියන 559 මූල් සිතියමේ $8\frac{1}{2}$Mන් පේන අක්කර 2කුත් පර්චස් 38ක් බිම්තරම ඇති සාමාන්‍ය වශයෙන් ඉළුක්හේන කියන නොහොත් ඒ නමින් දැනගෙන තිබෙන බිම්කට්ටියට මායිම්:—උතුරට ආණ්ඩුව විසින් විකුනාපු කන්දේහේනද, (326,711 පිඹුරුකඩදාසියේ පේන ඉඩම), ප්‍රවෙනි අන්නැහිගොල්ලේ වතුයායද, ආණ්ඩුව විසින් අයිතිකම්කියන ඉළුක්හේනද; නැගෙනහිරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන ඉළුක්හේනද; දකුණට ආණ්ඩුව විසින් අයිතිකම් කියන ඉළුක්හේනද, ආණ්ඩුව විසින් අයිතිකම්කියන බෝගහමූලහේනද; බස්නාහිරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන බෝගහ මූලහේනද, ආණ්ඩුව විසින් විකුනාපු කන්දේහේනද, (326,711 පිඹුරුකඩදාසියේ පේන ඉඩම.)

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 394වෙනි පිටේ ප්ලෑනය බලනු.

[කුරුනෑගල වි. ම. 19—1918.]

---

[කුරුණෑගල දැන්වීම නො. 6,786.]

වර්‍ෂ 1918ක්වූ මාර්තු මස 8වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩි ගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවළුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්‍ෂ 1897, 1899, 1900, සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඇන්. ඒ. හැම්ප්ටන් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඒවා ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඇන්. ඒ. හැම්ප්ටන්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

ඉඩම්වල තොරතුරු.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ කටුගම්පොලහත්පත්තුවේ දකුණු යටිකහකෝරලේ කුලියාපිටිය යන ගම පිහිටා තිබෙන මිට අමුනාපු සිතියම්වල* පෙනියන මෙහි පහත දක්වන බිම්කට්ටි එනම්:—

I.—මූල් සිතියම 978.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 2E1A | පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය | 0 0 2 |
| 2E1B | මහපාර | 0 0 $0\frac{1}{16}$ |
| 2E1C | පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය | 0 0 $0\frac{5}{8}$ |
| 2F1A | එම | 0 0 2 |
| 2F1C | මහපාර | 0 0 $0\frac{5}{8}$ |
| | | 0 0 $5\frac{5}{16}$ |

මිට මායිම්—උතුරට කානා. කයිලාසන් පිල්ලෙයි විසින් අයිතිකම්කියන කදුරුගහමූලවත්තද, දිස්සානායක මුදියන්සේලාගේ කිරිමැනිකා සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන කදුරුගහමූලවත්තද; නැගෙණහිරට, දකුණට සහ බස්නාහිරට නාරම්මල හිට මාදම්පේට යන රජසන්තක මහපාරද.

II.—මූල් සිතියම 978.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 3AK | මහපාර | 0 0 $0\frac{5}{8}$ |

මිට මායිම්— උතුරට බන්නකමුදියන්සේලාගේ වත්තිහාමි සහ ගුරුහාමි විසින් අයිතිකම්කියන දෙරකඩවෙලවත්තද, දිස්සානායකමුදියන්සේලාගේ කළුහාමි විසින් අයිතිකම්කියන දෙරකඩවෙලවත්තද, හේරත්මුදියන්සේලාගේ අප්පුහාමි කෝරාල විසින් අයිතිකම්කියන දෙරකඩවෙලවත්තද; නැගෙණහිරට, දකුණට සහ බස්නාහිරට නාරම්මල හිට මාදම්පේට යන රජසන්තක මහපාරද.

III.—මූල් සිතියම 978.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 3P1G | මහපාර | 0 0 $0\frac{5}{8}$ |

මිට මායිම්—උතුරට රජසන්තක මහපාරද, හේරත්මුදියන්සේලාගේ අප්පුහාමි කෝරාල විසින් අයිතිකම්කියන ඉන්නවත්තද, දිස්සානායකමුදියන්සේලාගේ කළුහාමි සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන ඉන්නවත්තද, බන්නකමුදියන්සේලාගේ ගුරුහාමි සහ බන්ඩා විසින් අයිතිකම්කියන ඉන්නවත්තද; නැගෙණහිරට, දකුණට සහ බස්නාහිරට නාරම්මල හිට මාදම්පේට යන රජසන්තක මහපාරද.

IV.—මූල් සිතියම 978.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 3Q1A | පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය | 0 0 $0\frac{1}{8}$ |

මිට මායිම්—උතුරට නාරම්මල හිට මාදම්පේට යන මහපාරද; නැගෙණහිරට දියකලේමුල්ලේ පදිංචි රනතුංගමුදියන්සේලාගේ හෙන්ද්‍රික්සිඤ්ඤෝ සහ තවත් අය විසින් අයිතිකම්කියන පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටියද; බන්නකමුදියන්සේලාගේ කපුරුහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන පහලවෙලද; බස්නාහිරට මාදම්පේ හිට නාරම්මලට යන මහපාරද.

V.—මූල් සිතියම 978.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 3Q1C | පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය | 0 0 $0\frac{1}{16}$ |

මිට මායිම්—උතුරට නාරම්මල හිට මාදම්පේට යන මහපාරද; නැගෙණහිරට සහ දකුණට බන්නකමුදියන්සේලාගේ කපුරුහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන පහලවෙලද; බස්නාහිරට දියකලමුල්ල පදිංචි රනතුංග මුදියන්මුදියන්සේලාගේ හෙන්ද්‍රික් සිඤ්ඤෝ විසින් අයිතිකම්කියන පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටියද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 394—399වෙනි පිටුවල ප්ලෑන් බලනු.

VI.—මුල් සිතියම 978.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 3T1A | පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය | 0 0 0$\frac{3}{16}$ |
| 3U1A | එම | 0 0 0$\frac{3}{4}$ |
| | | 0 0 0$\frac{15}{16}$ |

මීට මායිම්—උතුරට මාදම්පේ හිට නාරම්මලට යන මහපාරද; නැගෙණහිරට ආනා. චේනා. චූනා. අහමදු තම්බි විසින් අයිතිකම්කියන පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටියද, එම අය විසින් අයිතිකම්කියන තලවෙලපිල්ලෑවද; දකුණට බාරි ගොඩ පදිංචි පීරිස්ප්‍රෙරුකු විසින් අයිතිකම්කියන ඉහලවෙලපිල්ලෑවද; බස්නාහිරට ඒකනායකමුදියන්සේලාගේ බන්ඩා කෝරාල විසින් අයිතිකම්කියන ඉහලවෙලපිල්ලෑවද.

VII.—මුල් සිතියම 978.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 3AA1A | පාරටඉතුරුකර තිබෙන බිම්කට්ටිය | 0 0 0$\frac{3}{16}$ |

මීට මායිම්—උතුරට මාදම්පේ හිට නාරම්මලට යනපාරද; නැගෙනහිරට සහ දකුණට දිස්සානායකමුදියන්සේලාගේ කිරිමැනිකා විසින් අයිතිකම්කියන ඉහලවෙලේපිල්ලෑවද; බස්නාහිරට ආනා. චේනා. චූනා. අබ්දුල්කාදර් විසින් අයිතිකම්කියන ඉහලවෙලේපිල්ලෑවද.

VIII.—මුල් සිතියම 978.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 4C1 | මහපාර | 0 0 1$\frac{1}{16}$ |
| 17A1A | පාරටඉතුරුකර තිබෙන බිම්කට්ටිය | 0 0 13$\frac{3}{4}$ |
| 16A1B | මහපාර | 0 0 1 |
| | | 0 0 15$\frac{13}{16}$ |

මීට මායිම්—උතුරට රජසන්තක මාදම්පේ හිට නාරම්මලට යන පාරද; නැගෙණහිරට දිසානායකමුදියන්සේලාගේ මෙනුහාමි විසින් අයිතිකම්කියන ඉහලවෙලවත්තද නොහොත් දන්ගොල්ලහේනද; දකුණට සහ බස්නාහිරට ආනා. චේනා. චූනා. සෙයික් අබ්දුල්කාදර් සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන ඉහලවෙලවත්තද.

IX.—මුල් සිතියම 978.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 4C2 | මහපාර | 0 0 1$\frac{1}{8}$ |

මීට මායිම්—උතුරට සහ නැගෙණහිරට රජසන්තක මාදම්පේ හිට නාරම්මලට යන මහපාරද; දකුණට සහ බස්නාහිරට දිස්සානායකමුදියන්සේලාගේ මෙනුහාමි විසින් අයිතිකමකියන ඉහලවෙලවත්ත නොහොත් දන්ගොල්ලහේනද.

X.—මුල් සිතියම 978.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 9C | මහපාර | 0 0 16$\frac{5}{16}$ |
| 9R | මහපාර | 0 0 1$\frac{1}{4}$ |
| | | 0 0 17$\frac{9}{16}$ |

මීට මායිම්—උතුරට 116,751 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩමද; නැගෙණහිරට හෙට්ටිපොල හිට මාදම්පේට යන පාරද; දකුණට සහ බස්නාහිරට නාරම්මල හිට මාදම්පේට යනපාරද.

XI.—මුල් සිතියම 978.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 9M | මහපාර | 0 0 0$\frac{3}{8}$ |

මීට මායිම්—උතුරට රජසන්තක මාදම්පේ හිට නාරම්මලට යන මහපාරද; නැගෙණහිරට, දකුණට සහ බස්නාහිරට 134,426 පිඹුරුකඩදාසියේ පේන ඉඩමද.

XII.—මුල් සිතියම 978.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 9N | පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය | 0 0 0$\frac{5}{8}$ |
| 9P | එම | 0 0 0$\frac{1}{8}$ |
| | | 0 0 0$\frac{3}{4}$ |

මීට මායිම්—උතුරට රජසන්තක මාදම්පේ හිට නාරම්මලට යන මහපාරද; නැගෙණහිරට රජසන්තක අම්බලමද; දකුණට 11[illegible],694 පිඹුරුකඩදාසියේ පේන ඉඩමද; බස්නාහිරට මාදම්පේ හිට නාරම්මලට යන මහපාරද.

XIII.—මුල් සිතියම 978.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 9O | මහපාර | 0 0 0$\frac{3}{16}$ |

මීට මායිම්—උතුරට රජසන්තක මාදම්පේ හිට නාරම්මලට යන මහපාරද; නැගෙණහිරට සහ දකුණට 116,752 පිඹුරුකඩදාසියේ පේන ඉඩමද; බස්නාහිරට රජසන්තක අම්බලමද.

XIV.—මුල් සිතියම 978.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 13C1 | මහපාර | 0 0 0$\frac{3}{8}$ |

මීට මායිම්—උතුරට රජසන්තක මාදම්පේ හිට නාරම්මලට යන මහපාරද; නැගෙණහිරට සහ දකුණට ආන්නා. චේනා. චූනා. සෙයික් අබ්දුල්කාදර් සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන දන්කැල්ලහේනද; බස්නාහිරට මාදම්පේ හිට නාරම්මලට යන රජසන්තක මහපාරද.

XV.—මුල් සිතියම 978.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 17C1A | පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය | 0 0 1 |
| 17C1B | මහපාර | 0 0 0$\frac{1}{8}$ |
| 17E1A | එම | 0 0 0$\frac{1}{4}$ |
| | | 0 0 1$\frac{3}{8}$ |

මීට මායිම්—උතුරට දිස්සානායකමුදියන්සෙලාගේ පුන්චිබන්ඩා අප්පුහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන අඹගහ මුලවත්තද, ජයකොඩිආරච්චිලාගේ දෛන් සිරිවර්ධන අප්පුහාමි විසින් අයිතිකම්කියන සියඹලාගහමුලවත්තද; නැගෙණහිරට ජයකොඩිආරච්චිලාගේ දෛන් සිරිවර්ධන අප්පුහාමි විසින් අයිතිකම්කියන පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටියද; දකුණට සහ බස්නාහිරට රජසන්තක නාරම්මලහිට මාදම්පේට යන මහපාරද.

[කුරුණෑගල බි. ම. 20—1918.]

[පුත්තලම් දැන්වීම නො. 6,787.]

**වර්‍ෂ 1897තේ, 1899යේ, 1900යේ සහ 1903නේ මුඩු ඉඩම් සම්බන්ධ ආඥාපනත් ප්‍රකාර දැනුම්දීම.**

මෙහි පහත සඳහන්වෙන ඉඩම් සම්බන්ධව අයිතිවාසිකමක් ඇති කෙනෙක් ඉන්නවානම් ඒ අය වර්‍ෂ 1918ක්වූ මාර්තු මස 8වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත තමාම නොහොත් ලියවිල්ලකින් පුත්තලම කච්චේරියට ඇවිත් උප ඒජන්ත උන්නාන්සේ ඉදිරිපිට පෙණීසිට එකී ඉඩම්වලට තිබෙන අයිතිකම නොහොත් ඒ සම්බන්ධව තිබෙන වැදගත්කම කියා නොසිටි යොත් එකී පුත්තලම් උප ඒජන්ත උන්නාන්සේ විසින් වර්‍ෂ 1897තේ 1වෙනි ආඥාපණතෙන් උන්නාන්සේට ලැබී තිබෙන බලපුළුවන්කම්වල ප්‍රකාරයට, අයිතිකමක් කියා නොසිටිය ඒ ඉඩම් රජසන්තක ඉඩම් බව උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් එළිදරව්කරණ බව මෙයින් දැනගත යුතුයි.

ඩබ්ලිව්. ඒ. වෙව්,
පුත්තලම සහ හලාවත ආණ්ඩුවේ උපඒජන්ත වර්‍ගය.

කියන්නේ ඉඩම් ගැණයි.

වයඹ දිසාවේ පුත්තලම් දිස්ත්‍රික්කුවේ පුත්තලම්පත්තු කොඨාසයේ පුත්තලම්පත්තුවේ තිරම්බිඅඹිළුච්චන් කියන ගමේ මීට යාකර තිබෙ සිතියමේ* පෙනෙන මෙහි පහත සඳහන්වූ ඉඩම් :—

මුල් සිතියම 2,706.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. | බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්රතම, අ. රූ. ප. |
|---|---|---|---|---|---|
| 12258 | තිරඹිඅඹිළුච්චන්කාඩු .. | .. 58 0 26 | 14273 | තිරඹිඅඹිළුච්චන්කාඩු ... | .. 24 1 33 |
| 12259 | එම .. | .. 55 2 12 | 12274 | එම .. | .. 12 0 30 |
| 12260½ | ලුණුඅලංවලට ලී කපාගැනීමට ඇර තිබෙ | 6 0 28 | 12275 | එම .. | .. 5 2 20 |
| 12262 | තිරඹිඅඹිළුච්චන්කාඩු .. | .. 29 2 20 | 12276 | එම .. | .. 12 0 36 |
| 12266 | එම .. | .. 55 2 0 | 12277 | එම .. | .. 11 0 8 |
| 12267 | එම .. | .. 55 2 0 | 12278 | එම .. | .. 11 2 8 |
| 12268 | එම .. | .. 55 3 20 | 12279 | එම .. | .. 11 3 0 |
| 12269 | එම .. | .. 54 2 15 | 12280 | එම .. | .. 11 3 20 |
| 12270 | එම .. | .. 27 0 0 | 12281 | එම .. | .. 3 2 0 |
| 12271 | එම .. | .. 22 1 10 | | | |
| 12272 | එම .. | .. 23 1 14 | | | 547 3 19 |

මීට මායිම්—උතුරට උතුරට සහ නැගෙණහිරටත් සෙල්ලන්කන්ඩුවේ ආණ්ඩුවේ මූකලාන; දකුණට පුත්තලම සිට අනුරාධපුරයටයට යන පාර; බස්ණවට නොම්මර 187,551 දරණ කට්ටි පැලෑනේ සඳහන් ඉඩමද, ආණ්ඩුවට අයිති තිරම්බිඅඹි ළුච්චන් කියන කැලේද, නොම්මර 239,135 දරණ කට්ටි පැලෑනේ ඉඩම සහ ලුණුඅලන්වලට ලී කපාගැණීමට ඇර තිබෙන ඉඩමත්ය.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 400වෙනි පිටේ ප්ලෑනය බලනු.

## ඉඩම් ආණ්ඩුවට ගැනීමේ දැන්වීම.

නැගෙණහිර දිසාවේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කේ තම්බලගම් පත්තුවේ චේනන්වඩි යන ගමේ පිහිටා තිබෙන්නාවූද, අක්කර තුණකුත් රූඩ් එකකුත් පර්චස් දෙකක් වපසරිය ඇතිවූද මීට අමූනා තිබෙන හැඩුල් පත්‍රයේ විස්තර සටහන්වූද ඉඩම් කැබැල්ල ආණ්ඩුව විසින් සහ ආණ්ඩුව වෙනුවෙන් ලියාදෙන ලද්දේවීනමුත් එය දැනට අවුරුදු අටකට වැඩි කාලයක් මුළුල්ලේ අයිතිකාරයන් විසින් අත්හැරදමා තිබෙන බව පෙණෙන නිසා මා විසින් කඩිසරවූද සැහෙන්නාවූද සියලුම වගවිභාගකරණලැබූ නමුත් එබඳු අයිතිකාරයන්වත් නීති ප්‍රකාර අයිතිකමක් කියාසිටින කෙනෙක්වත් සොයාගන්ට බැරිබැවින් නැගෙණහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්තධූරන්ධර රිචර්ඩ් ආර්නර් ග්‍රිණෙඩ්ල් ෆේපස්ටිං යන මා වර්‍ෂ 1887තේ අංක 4 දරණ ආඥාපණතෙන් මට ලැබී තිබෙන බලපුළුවන්කම් කාරණකොටගෙණද ගරුතර ආණ්ඩුකාර උතුමාණන්වහන් සේගේ සම්මතය ඇතුවද මෙයින් ප්‍රකාශකරණ වගනම්—එකී ඉඩමට තම අයිතිකම ඔප්පුකළහැකි කෙනෙක් විසින් හෝ එබඳු අයෙක් වෙනුවෙන් කෙනෙක් විසින් හෝ වර්‍ෂ 1919යේ අප්‍රේල් මස 19වෙනි දින හෝ ඊට මත්තෙන් අයිතිකම මට කියා නොසිටියොත් එම ඉඩම එකී ආඥාපණතේ 2වෙනි වගන්තියේ ප්‍රකාර ආණ්ඩුව විසින් ආපසු ගන්නාබව ඒව වැදගන්නා සියල්ලෝම දැනගනිත්වා.

මා විසින් අත්සන්කොට මඩකලපුවේ කච්චේරියේදී දෙන්ට යෙදුනේ වර්‍ෂ 1918ක්වූ පෙබරවාරි මස නමවෙනි දිනදීය.

ආර්. ඒ. ජී. පැස්ටිං,
නැ. දි. ආණ්ඩුවේ ඒජන්ත වර්‍ගය.

---

එකී හැඩුල් පත්‍රය.

ත්‍රිකුණාමලේ තම්බලගම් පත්තුවේ චේනන්වඩියේ පිහිටා තිබෙන අංක 711හේ මුල් සිතියමේ (ටයිටල් ප්ලෑන 103,574) අංක 8821 ලකුණුකර තිබෙන ඉඩම්කැබැල්ල.

මායිම—බස්නාහිරට ආණ්ඩුවට අයිතියකියන ඉඩම අනිත් සියලුම පැතිවලට "තෝනා" නම් දියවළ.

වපසරිය—අක්කර 3යි රූඩ් 1යි පර්චස් 2යි.

මෙම ඉඩම 1876යේදී කාදර් මියදින් සින්නතම්බිට ආණ්ඩුවේ ඔප්පුවක් පිට ලියාදෙනලදී.

## ඉල්ලුම්පත්‍ර සඳහා කරණලද දැන්වීම.

කොහොලන්කල ලේවායේ ගොඩදමා තිබෙන ලුණු හොණ්ඩර 14,000 මසකට සාමාන්‍යවශයෙන් හොන්ඩර 10,000 බැගින් හම්බන්තොට ගුදම්වලට ගෙණඒම පිණිස ඉල්ලුම්පත්‍ර මෙයින් උවමනාකරනු ලැබේ.

2. සියලුම ඉල්ලුම්පත්‍ර පිටපත් දෙකකින් යුක්තවියයුතුය. තවද එකක් කවරයක් තුළ බහා සීල්කර හම්බන්තොට උප ඒජන්ත උන්නාන්සේගේ නමට එවියයුතුය.

3. මුල් ඉල්ළුම්පත්‍රය උපඒජන්ත උන්නාන්සේට යවනවා සමගම දෙවෙනි පිටපත ඉල්ළුම්කාරයා විසින් ගරුකටයුතු ආදායම් දෙපාතීමේන්තුවේ ප්‍රධානතැන වෙත යවන්ට ඕනෑය.

4. සියලුම ඉල්ලුම්පත්‍රවල කවරයේ වම්පැත්තේ උඩින් "ලුණු ඇදීමට ඉල්ලුම්පත්‍රය" කියා ලකුණුකලයුතුවා පමණක් නොව වර්‍ෂ 1918ක්වූ මාර්තු මස 14වෙනි දින දවල් 12ට ප්‍රථම ඒවා උපඒජන්ත උන්නාන්සේගේ කන්තෝරුවට ලැබෙන්ට ඕනෑය.

5. සියලුම ඉල්ලුම්පත්‍ර හම්බන්තොට කච්චේරියෙන් ලබාගන්නාලද පෝම්කොලවල වියයුතුය. එම පෝම්කොලවල නොවන ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ.

6. ඉල්ලුම් පෝම්කොල ලබාගන්ට ප්‍රථම තංගල්ලේ ත්‍රිසූරියේ හෝ වෙන කොයිම කච්චේරියක නුමුත් රුපියල් 20ක් බැඳ ලබාගන්නාලද කුවිතන්සියක් පෙන්වන්ට ඕනෑය. ඉල්ලුම්පත්‍රය භාරගත් බැව් දැනුම්දී දෙපාතීමේන්තුවේ ප්‍රධාන තැනගෙන් හෝ ඒ වෙනුවෙන් පත්කරණලද වෙනයම් මූලාදැනියෙකුගෙන් ආඥාවක් ලැබී දවස් 10ක් තුළ කොන්ත්‍රාත්තුවට බැඳී ඔප්පුව අත්සන් නොකර පැහැරහැරියොත් නොහොත් නියමකරනලද ඇපය දෙන්ට නුපුළුවන් උනොත් ඉහතකී මුදල රජසන්තක වෙනවා ඇත. කොන්ත්‍රාත්තුව අත්සන්කළාටපසු අනිකුත් සියලුම මුදල් ආපසු ගෙවනවාඇත.

7. එක එක ඉල්ලුම්පත්‍රය වගකියහැකි අය දෙදෙනෙක් විසින් අත්සන්කරණලද ලියමණක් සමග එවිය යුතුය. ඒ දෙදෙනාගේ නම ගම සහ තැපැල්පල ඒ ලියමනේ සඳහන්

කරන්ට ඕනෑවා පමණකුත්නොව කොන්ත්‍රාත්තුව නිසියාකාර කරනලෙස ඔවුන් ඇපයට බැඳෙන්ටද ඕනෑය.

8. එක එක කොන්ත්‍රාත්තුව නිසියාකාර කරණලෙස ඔප්පුවකට බැඳීමට සෑහෙනතරම් ඇපකාරයෝ උවමනාය. උවමනාකරණ ඇප මුදල රුපියල් 500ක් වේ. වෙනත් සියලූම තොරතුරු 5වෙනි වගන්තියේ සඳහන් කන්තෝරුවෙන් දැනගන්ට පුළුවන.

9. ලුණුමළු කිරීමටද පැටවීම සහ බෑමද ආණ්ඩුවේ වියදමෙන් කරනු ලැබේ.

10. ඉහතකී සියළුම කාරනාවලට එකඟනොවන කොයිම ඉල්ලුම්පත්‍රයක්වත් භාරගනු නොලැබේ.

11. එකක් හෝ සියලුම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂෙපකිරීමටද, යම් ඉල්ලුම්පත්‍රයකින් කොටසක් භාරගැනීමටද බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

ඩබ්ලිව්. ඇල්. මර්පි,
ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1918ක්වූ පෙබරවාරි මස 27වෙනි
දින හම්බන්තොට කච්චේරියේදීය.

---

පුත්තලමේ දකුණු ඩිපෝඑකේ නොම්මර 25, 26 සහ 27ත් දරණ ලුණු ස්ටෝරු අළුත්වැඩියාකෙරීම පිණිස ඉල්ළුම්පත්‍ර භාරගනු ලැබේ.

2. ඉල්ලුම්පත්‍රය සීල්කර වහපු ඇන්විලොප් එකක් තුළ දමා එවන්ට ඕනෑය. එකී ඇන්විලොප් එක උඩ වම්පැත්ත කොණෙන් මින් පහත සඳහන් වචන ලියා තිබෙන්ට ඕනෑය. එනම්, පුත්තලමේ දකුණු ලුණු ඩිපෝඑකේ නොම්මර 25, 26 සහ 27ත් දරණ ලුණු ස්ටෝරු අළුත්වැඩියාකිරීමට ඉල්ලුම්පත්‍රයයි." තවද එම ඉල්ලුම්පත්‍රය වර්ෂ 1918ක්වූ මාර්තු මස 19වෙනි දින පස්වරු එකට මත්තෙන් පුත්තලමේ ආණ්ඩුවේ උපඒජන්ත උන්නාන්සේට ලැබෙන පිණිස එවන්ටත් ඕනෑය.

3. ඉල්ලන්ට අදහස්කරණ තැනැත්තා ඉල්ලුම්පත්‍රය එවන්ට ප්‍රථමයෙන් කොයිම කච්චේරියකහරි "වැන්ඩර්පෝර්ම්ස්" යන ගණන යටතේ රුපියල් 10ක් බැඳ රිසිට් එකක් ලබාගන්ට ඕනෑය. එසේ ලබාගත් රිසිට් එක ඔහුගේ ඉල්ලුම්පත්‍රයට යාකර එවන්ට ඕනෑය.

4. මෙසේ බඳිනලද රුපියල් දහය (10) උපඒජනත උන්නාන්සේ විසින් ඇපයක් වශයෙන් තබාගනු ලැබේ. එනම් ඉල්ලුම්කාරයෙකුගේ ඉල්ළුම්පත්‍රය භාරගත් කල්හි එකී ඉල්ලුම්කාරයා භාරගත් වැඩේ සතුටුදායක අන්දමකට සෑහෙන කාලයක් ඇතුලත ඉවරකර භාරදෙන හැටියට උප ඒජන්ත උන්නාන්සේ සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙන පිණිස ඇපයක් හැටියටයි. එසේ සෑහෙන කාලයක් ඇතුළත එකී කොන්ත්‍රාත්තුවට බැඳෙන්ට නොයෙදුනොත් එම ඇප මුදල රාජසන්තක කරණු ලැබේ.

5. ඉල්ලුම්කාරයාට පුත්තලමේදී ලැබෙන පිණිස නොහොත් භාරදෙන පිණිස පුළුවන්වෙන ඇඩ්‍රෑස් එකක් සඳහන්කරන්ට ඕනෑය.

6. කොන්ත්‍රාත්තුවට බැඳී සුමාන 3ක් ඇතුළතදී වැඩේකර ඉවරකරන්ට ඕනෑය.

කරන්ට තිබෙන වැඩවල විස්තර.

දැනට ගොඩනැගිලිවල තිබෙන්නාවූ සියලුම දිරාගිය නොහොත් වෙන යම් විදියකට පාවිච්චිකරන්ට නුපුළුවන් පොල් අතු ලීදඬු යනාදිය අහක්කොට ඒවා වෙනුවට අළුත් සවි ඇති ඒවා දමන්ට ඕනෑය.

මතුකී සියළුම ගොඩනැගිලිවල වහලවල් අලුත් පොල්අතුවලින් සෙවිලිකරන්ට ඕනෑය.

එම වහලවල් උඩ බර වෙනුවට මාංගු තබන්ට ඕනෑය.

පොල්අතු බිච්චි ඕනෑකරණ තැන්වල අළුත්වැඩියා කරන්ට ඕනෑය. එබී තිබෙන තැන් කෙලින්කරන්ටත් ඕනෑය.

ස්ටෝරුවල ඇතුල් පැත්තට අළුත් පොල්අතු අල්ලන්ට ඕනෑය. වහලේ ඉහළ තුන්හුළස් කොටස පැත්තේ වැටවල්වලට අනුබලදෙන්ට ඕනෑය.

ඇස්. ඇම්. පී. වැන්ඩර්කෝන්,
උප ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1918ක්වූ පෙබරවාරි මස 26වෙනි
දින පුත්තලම් කච්චේරියේදීය.

---

පුත්තලමේ උතුරු ලුණු ඩිපෝ එකේ නොම්මර 17, 18, 19 සහ 20ත් දරණ ලුණු ස්ටෝරු අළුත්වැඩියා කෙරීමට ඉල්ලුම්පත්‍ර භාරගනු ලැබේ.

2. ඉල්ලුම්පත්‍රය සීල්කර වහපු ඇන්විලොප් එකක් තුළ දමා එවන්ට ඕනෑය. එම ඇන්විලොප් එක උඩ වම්පැත්ත කොණෙන් මින් පහත සඳහන් වචන ලියා තිබෙන්ට ඕනෑය. එනම්:—"පුත්තලමේ උතුරු ඩිපෝඑකේ නොම්මර 17, 18, 19 සහ 20 දරණ ලුණු ස්ටෝරු අළුත්වැඩියා කෙරීමට ඉල්ලුම් පත්‍රයයි." තවද එකී ඉල්ලුම්පත්‍රය වර්ෂ 1918ක්වූ මාර්තු මස 18වෙනි දින පස්වරු එකට මත්තෙන් පුත්තලමේ ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේට ලැබෙන පිණිස එවන්ට ඕනෑය.

3. ඉල්ලන්ට අදහස්කරණ තැනැත්තා ඔහුගේ ඉල්ලුම් පත්‍රය එවන්ට මත්තෙන් "වැන්ඩර් පෝර්ම්ස්" යන ගණන යටතේ රුපියල් 10ක් කොයිම කච්චේරියක හරි බැඳලා රිසිට් එකක් ලබාගන්ට ඕනෑය, එම රිසිට් එක ඔහුගේ ඉල්ලුම් පත්‍රයට යාකර එවන්ටඕනෑය.

4. ඉල්ලුම්කාරයෙකුගේ ඉල්ලුම්පත්‍රය භාරගත්කල්හි භාරගත් වැඩේ සතුටුදායක අන්දමකට ඉවරකරදෙන හැටියට උප ඒජන්ත උන්නාන්සේ සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙන පිණිස මතුකී රුපියල් 10ය ඇපයක් වශයෙන් තබාගන්ට යෙදේ. ඉල්ලුම්පත්‍රයක් භාරගත්තායින් පසු සෑහෙන කාලයක් ඇතුළතදී එවැනි කොන්ත්‍රාත්තුවට බැඳෙන්ට නොයෙදුනොත් මතුකී රුපියල් 10ය රාජසන්තක කරණු ලැබේ.

5. ඉල්ලුම්කාරයාට පුත්තලමේදී ලිවුම් භාරදීම පිණිස නොහොත් ලැබෙන පිණිස ඇඩ්‍රෑස් එකක් සඳහන්කරන්ට ඕනෑය.

6. කොන්ත්‍රාත්තුවට ඇතුල්වී සුමාන 4ක් ඇතුළතදී භාරගත් වැඩේකර ඉවරකරන්ට ඕනෑය.

7. වැඩිදුර කාරණ පුත්තලමේ ලුණු ඉන්ස්පැක්ටර් මහතාගෙන් දැනගන්ට පුළුවන.

කරන්ට තිබෙන වැඩවල විස්තර.

දැනට ගොඩනැගිලිවල තිබෙන්නාවූ සියළුම දිරාගිය නොහොත් වෙන යම් විදියකට පාවිච්චිකරන්ට නුපුළුවන් පොල් අතු, ලීදඬු යනාදිය අහක්කොට ඒවා වෙනුවට අළුත් සවි ඇති ඒවා දමන්ට ඕනෑය.

මතුකී සියලුම ඉස්ටෝරුවල වහලවල්වලට අලුත් පොල් අතු බඳින්ට ඕනෑය. නොම්මර 17 සහ 18ත් දරණ ස්ටෝරුවල වහලවල්වල පලුදුවී තිබෙන කනු අහක්කොට වහලේ බඳින්ට ප්‍රථම අලුතෙන් බඳින්ට ඕනෑය.

වහලවල් උඩ බරවෙනුවට මාංගු දමන්ට ඕනෑය.

පොල්අතු බිච්චිවල ඕනෑකරණතැන් අලුත්වැඩියාකරන්ට ඕනෑය. එම බිච්චිවල එබී තිබෙන තැන් කෙලින්කරන්ට ඕනෑය.

සෑම ස්ටෝරුවලම ගේබිම් ඕනෑකරන තැන්වලට මැටිදමා උස්කර, සමතලාකර තදකරන්ට ඕනෑය.

ස්ටෝරුවල් ඇතුල්පැත්තට අළුත් පොල්අතු අල්ලන්ට ඕනෑය.

නොම්මර 17, 18 සහ 20ත් දරණ ස්ටෝරුවල දොරවල්වලට සරනේරු සහ ඇනත් සවිකරන්ට ඕනෑය.

ඇස්. ඇම්. පී. වැන්ඩර්කෝන්,
ආණ්ඩුවේ උපඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1918ක්වූ පෙබරවාරි මස 26වෙනි
දින පුත්තලම් කච්චේරියේදීය.

---

නාච්චිකල්ලියේ තිබෙන නොම්මර 17 සහ 5ත් දරණ ලුණු ස්ටෝරු අළුත්වැඩියා කෙරීමට ඉල්ලුම්පත්‍ර භාරගනු ලැබේ.

2. ඉල්ලුම්පත්‍රය සීල්කර වහපු ඇන්විලොප් එකක් තුල දමා එවන්ට ඕනෑය. එම ඇන්විලොප්එක උඩ වම්පැත්තේ මින් පහත සඳහන් වචන ලියා තිබෙන්ට ඕනෑය. එනම්, "නාච්චිකල්ලියේ තිබෙන නොම්මර 17 සහ 5ත් දරණ ස්ටෝරු අළුත්වැඩියාකෙරීමට ඉල්ලුම් පත්‍රයයි." තවද ඉල්ලුම්පත්‍රය වර්ෂ 1918ක්වූ මාර්තු මස 19වෙනි දින පස්වරු එකට මත්තෙන් පුත්තලමේ ආණ්ඩුවේ උපඒජන්ත උන්නාන්සේට ලැබෙන පිණිස එවන්ට ඕනෑය.

3. ඉල්ලන්ට අදහස්කරණ තැනැත්තා ඔහුගේ ඉල්ලුම් පත්‍රය එවන්ට මත්තෙන් "වැන්ඩර් fපෝර්ම්ස්" යන ගණන යටතේ රුපියල් 10ක් කොයිම කච්චේරියක හරි බඳින්ට ඕනෑය. එසේ සල්ලි බැඳ ලබාගත් රිසිට් එක ඔහුගේ ඉල්ලුම් පත්‍රයට යාකර එවන්ට ඕනෑය.

4. ඉල්ලුම්කාරයෙකුගේ ඉල්ලීම භාරගත් කල්හි එම ඉල්ලුම්කාරයා භාරගත් වැඩේ සතුටුදායක අන්දමකට කරදෙන හැටියට පොරොන්දු පත්‍රයකට ඇතුල්වීම පිණිස මෙකී රුපියල් 10 ඇපයක් වශයෙන් තබාගන්ට යෙදේ. ඉල්ලුම්පත්‍රය භාරගෙණ සෑහෙන කාලයක් ඇතුළතදී එකී පොරොන්දු පත්‍රයට ඇතුල් නොවුනොත්, මතුකී ඇප මුදල රාජසන්තක කරණු ලැබේ.

5. ඉල්ලුම්කාරයාට පුත්තලමේදී ලැබෙන පිණිස නොහොත් භාරදීම පිණිස ඇඩ්‍රෑස් එකක් සඳහන්කරන්ට ඕනෑය.

6. ෆොරෙන්දු පත්‍රයට ඇතුළත්වූනායින්පසු සුමාන 3ක් ඇතුළතදී වැඩකර ඉවරකරන්ට ඕනෑය.

කරන්ට තිබෙන වැඩවල විස්තර.

දූනට ගොඩනැගිලිවල තිබෙන්නාවූ සියලුම දිරාගිය නොහොත් වෙනයම් විදියකට පාවිච්චිකරන්ට නොසුදුසුවන් පොල් අතු ලිදඬු සහ අනිකුත් දේවල් අහක්කොට ඒවා වෙනුවට අළුත් සම්ඇති ඒවා දමන්ට ඕනෑය.

මතුකී ඉස්තෝරුවල වහලවල් අළුත් පොල්අතුවලින් සෙවිලිකරන්ට ඕනෑය.

වහල්වල් උඩ බර වෙනුවට මාංගු දමන්ට ඕනෑය. ඒ මාංගු වහල උඩ තදකර තබන්ට ඕනෑය.

වැටවල්වලට අළුත් පොල්අතු අල්ලන්ට ඕනෑය.

සෙයිබිම් තදකර සමතලාකරන්ට ඕනෑය.

නොම්මර 17තේ ඉස්තෝරුවේ දොරට සරනේරු සවිකරන්ට ඕනෑය

නොම්මර 5. දරණ ඉස්තෝරුවට අළුතෙන් කිරුම් මඩුවක් සාදන්ට ඕනෑය.

නොම්මර 5 දරණ ඉස්තෝරුවේ පැති බිත්ති අළුත්වැඩියා කරන්ට ඕනෑය. එම බිත්තිවල එබී තිබෙන තැන් කෙළින් කරන්ට ඕනෑය. වහලත් කඩා අළුතෙන් බැඳ සෙවිලි කරන්ට ඕනෑය.

ඇස්. ඇම්. පී. වැන්ඩර්කෝන්,
උප ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1918ක්වූ මාර්තු මස 2වෙනි දින
පුත්තලම් කච්චේරියේදිය.

---

## රා සහ අරක්කු තැබෑරුම් සම්බන්ධ වර්ෂ 1912යේ අඩක 8 දරන ව්‍යවස්ථාව යටතේ දැන්වීම.

### රා විකුණන තැබෑරුමක් වෙනස්කිරීම සඳහා දැන්වීම.

මෙහි පහත දක්වන හැඩුල්පත්‍රයේ සඳහන්වන රා විකුණන තැබෑරුම වර්ෂ 1918ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් ස්ථානය වෙනස්කරන්ට අදහස්කර තිබෙන බව මෙයින් දන්වන්නේය.

2. වර්ෂ 1918ක්වූ අප්‍රේල් මස 20වෙනි දින වනතුරු එකී ස්ථානය සම්බන්ධව කාරණ ගෙනහැරපාන ලියවිලි භාරගන්ට මම ලෑස්තිව සිටිමි. එකී දවසේ අ. භා. 2ට ගාල්ලේ කච්චේරියේදී එකී ස්ථානය සම්බන්ධව මා සමග කටින් කියන කාරණ අහන්ට මම ලෑස්තිව සිටිමි.

වර්ෂ 1918ක්වූ මාර්තු මස 5වෙනි දින
ගාල්ලේ කච්චේරියේදිය.

ආර්. බී. හැලිංස්,
ආණ්ඩුවේ ඒජන්තතැන.

හැඩුල් පත්‍රය.

අම්බලන්ගොඩ සිට ඇල්පිටියට යන මහපාරේ හැතැක්ම් කණු 8¼ත් 9ත් අතරේ ඇල්පිටිය යන ගමේ පිහිටි රා තැබෑරුම අම්බලන්ගොඩ සිට ඇල්පිටියට යන මහපාරේ හැතැක්ම කණු 6ත් 7ත් අතරේ ස්ථානයකට මාරුකරන්ට අදහස්කර තිබේ.

---

### රා විකුණන තැබෑරුමක් ඇරීම සඳහා දැන්වීම.

මෙහි පහත දක්වන හැඩුල්පත්‍රයේ සඳහන්වන රා විකුණන තැබෑරුම වර්ෂ 1918ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් අරින්ට අදහස්කර තිබෙන බව මෙයින් දන්වන්නේය.

වර්ෂ 1918ක්වූ අප්‍රේල් මස 16වෙනි දින වනතුරු එකී ස්ථාන සම්බන්ධව කාරණ ගෙනහැරපාන ලියවිලි භාරගන්ට මම ලෑස්තිව සිටිමි. එකී දවසේ 2ටත් 4ටත් අතරතුර එකී ස්ථානය සම්බන්ධව මා සමග කටින් කියන කාරණ අහන්ට මම ලෑස්තිව සිටිමි.

වර්ෂ 1918ක්වූ පෙබරවාරි මස 28වෙනි දින
කෑගල්ලේ කච්චේරියේදිය.

ජී. ඇෆ්ජ්. ආර්. බ්‍රවුන්නිං,
ආණ්ඩුවේ උප ඒජන්ත.

හැඩුල් පත්‍රය.

කෑගල්ල දිස්ත්‍රික්කේ කෝරලතුනේ දෙහිගම්පල්මෙගොඩපොතපත්තුවේ යටියන්තොටවසමේ යටියන්තොට යන ගමේය.

---

### රා විකුණන තැබෑරුමක් වැසීම සඳහා දැන්වීම.

මෙහි පහත දක්වන හැඩුල්පත්‍රයේ සඳහන්වෙන රා විකුණන තැබෑරුම වර්ෂ 1918ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් වහන්ට අදහස්කර තිබෙන බව මෙයින් දන්වන්නේය.

2. වර්ෂ 1918ක්වූ මාර්තු මස 19වෙනි දින වනතුරු එකී ස්ථානය සම්බන්ධව කාරණ ගෙනහැරපාන ලියවිලි භාරගන්ට මම ලෑස්තිව සිටිමි. එකී දවසේ පස්වරු 2ටත් 4ටත් අතරතුර එකී ස්ථානය සම්බන්ධව මා සමග කටින් කියන කාරණ අහන්ට මම ලෑස්තිව සිටිමි.

වර්ෂ 1918ක්වූ පෙබරවාරි මස 28වෙනි
දින කෑගල්ලේ කච්චේරියේදිය.

ජී. ඇෆ්ජ්. ආර්. බ්‍රවුන්නිං,
ආණ්ඩුවේ උප ඒජන්තතැන.

හැඩුල්පත්‍රය.

කෑගල්ල දිස්ත්‍රික්කේ පරණකුරු කෝරලේ බස්නාහිර තුම්පලාත පත්තුවේ අරම වසමේ අරම යන ගමේ තිබෙන නොම්මර 9 දරණ රා තැබෑරුමය.

---

## සුප්‍රිම් උසාවියේ දැන්වීම.

ශ්‍රී ලංකාවීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රිම් උසාවියෙන් මට ලැබීතිබෙන අඥාවක බලය කරණකොටගෙණ මෙයින් ප්‍රකාශකරන්නේනම් රත්නපුර දිසාවේ ක්‍රිමිනෙල් නඩුවිභාගය වර්ෂ 1918ක්වූ මාර්තු මස 20වෙනි දින පෙරවරු 11 පැය පටන් කොළඹ තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවාඇත. එහි යම් කාරණ ඇතුව සිටින සෑම දෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත්අැර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින්පිටතට යන්ට නුසුදුවන් බවත් මෙයින් සෑමදෙනාටම දන්වන්නෙමි.

වර්ෂ 1918ක්වූ පෙබරවාරි මස 21වෙනි දින
පිස්කල් කන්තෝරුවේදිය.

සී. කොන්ස්ටැන්ටයින්,
පිස්කල් වර්‍ගහ.

---

## සනීපාරක්ෂක සභාවලට නිලකොලන් සමාජිකයින් තෝරාගැනීමේ දැන්වීම.

### නුවරකලාවිය දිස්ත්‍රික්කයේ රෝඩ් කොමිටියට සමාජිකයෙකෙනෙක් තෝරාගැණීම ගැණයි.

නුවරකලාවිය දිස්ත්‍රික්කේ රෝඩ් කොමිටියට බැදීසිටියාවූ සමාජික කෙනෙක් නැසීගිය හෙයින් පුරප්පාඩුවක්වී තිබේ. එම නිසා වර්ෂ 1861කේ නොම්මර 10 දරණ අඥාපනතේ 26වෙනි වගන්තිය යටතේ මෙයින් සියලුදෙනාටම දැනුම්දෙන්නේනම්, එකී පුරප්පාඩුවී තිබෙන්නාවූ නුවරකලාවිය දිස්ත්‍රික්කේ රෝඩ් කොමිටියට වර්ෂ 1918ට සහ 1919ටත් සමාජික කෙනෙක් ඕනෑවී තිබෙන බැවින් ඒගැන ඉල්ළුම්කාරයින් සිටිත්නම්, ඒ සඳහා කෙනෙක් තෝරාගන්නාවූ දිනේට අඩුගණනේ දවස් 10කට මත්තෙන් ඔවුන්ගේ අදහස් ලියුම්වලින් උතුරු මධ්‍යම දිසාවේ ප්‍රොවින්ෂියල් රෝඩ් කොමිටියේ ප්‍රධානතැන වෙත දන්වා සිටිය යුතුයි.

තවද ඉහත සඳහන් අඥාපණතේ 27වෙනි වගන්තියේ ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ මාර්තු මස 25වෙනි දින පස්වරු දෙකට අනුරාධපුරේ කච්චේරියේදී සමාජික කෙනෙක් තෝරාගන්නට යෙදෙනු ලැබේ.

වර්ෂ 1918ක්වූ පෙබරවාරි මස 26වෙනි දින
අනුරාධපුරේ ප්‍රා. රෝඩ් කොමිටියේදිය.

එච්. ආර්. ප්‍රිමන්,
උ. මැ. ප. ප්‍රො. රෝඩ් කොමිටියේ ප්‍රධානතැන.

(132 වෙනි පිට හා සම්බන්ධයි.)

කළුතර දිස්ත්‍රික්කේ සනීපාරක්ෂක සභාව විසින් වර්‍ෂ 1892කේ නොම්මර 18 දරණ ව්‍යවස්ථාවේ 9 E (2) කාණ්ඩය යටතේ සාදනලදුව නීතිප්‍රතිපාදක මන්ත්‍රණසභාවේ සම්මතය පිට ගරුතර ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් පිළිගන්නාලද මෙහි පහත සඳහන් උපාධ්‍යනීති සහ අයකරණ ගණන්ද මහජනයාගේ දැනගැණීම පිණිස ප්‍රසිද්ධකරණු ලැබේ.

ඉහත කියනලද ව්‍යවස්ථාවේ උප වගන්තිය අනුකූලව සනීපාරක්ෂක සභාව විසින් මීට පෙර සාදන්ට යෙදුන උපාධ්‍යනීති මෙයින් අවලංගුකරණලදී.

උතුමාණන්වහන්සේගේ අණපරිද්දෙන්,
ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම් වම්හ.

වර්‍ෂ 1918ක්වූ පෙබරවාරි මස 20වෙනි දින
කොළඹ මහලේකම් කන්තෝරුවේදීය.

1වෙනි පරිච්ඡේදය. [9 E (2) (a) යන වගන්තිය]. සඳහන්කරණලද අතුරු අණපණත්නම්.

සභාව පවත්වන වේලාව සහ ස්ථානයත් එහිදී පිළිපැදියයුතු ක්‍රමයත් මෙසේයි :—

1. ක්‍රියා සම්පාදනය උවමනාවූ යම් කාලයක සභාවේ සාමාන්‍ය රැස්වීම් කළුතර කච්චේරියේදී පවත්වනු ලැබේ. එසේවූවද යම් රැස්වීමක් අන්කිසි දිනයකට හෝ වේලාවකට කල්දැමීම සභාවට ව්‍යවස්ථානුකූල වේ.

2. සභාව සම්බන්ධ සියලුම කටයුතුවලදී සමාජිකයින්ගේ උස්පහත් පිළිවෙළ සහ ප්‍රථම ස්ථානය පහත දක්වනාකාර වියයුතුයි. (a) සභාපතිතැන. (b) ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධකර තිබෙන පිළිවෙළින් ආණ්ඩුකාරයාණන් විසින් පත්කරණලද සාමාජිකවරු.

3. සභාපතිතැන විසින් සභාව නිසිසේ හසුරුවාගත යුතුයි. වියවුල් සහිත සියලුම කාරණද බේරුම්කළ යුතුයි.

4. (සාමාන්‍ය හෝ විශෙෂ) රැස්වීමකට නියමකරණලද කාලය ඉකුත්වූ වහාම කටයුතුකිරීමට සෑහේයයි වැටහෙන සාමාජිකයින් ගණනක් පැමිණිකල්හි සභාපතිකමට නිසිව සිටින සාමාජිකතැන මූලාසනය භාරගෙණ සභාවේ කටයුතුකිරීම ආරම්භකළ යුතුයි. නියමකරණලද කාලයෙන් පැය භාගයක් ගතවූවිට සාමාජිකවරුන් සෑහෙන ගණනක් නොපැමිණ සිටියොත් එය සාමාන්‍ය රැස්වීමක් නම් ඊලඟ සාමාන්‍ය සභාරැස්වීමට නියමකරණලද දිනය වනතුරු කල්දැමිය යුතුයි. එය විශෙෂ සභාරැස්වීමක් නම් දිනයක් නියම නොකර කල්දැමිය යුතුයි.

5. සභාවේ කථාකරණ අතරතුරේදී මිස නොහොත් හදිස්සියක් ගැණ සභාවේ විශෙෂ අවසරය පිට මිස එසේ නැතුව යම් සාමාජිකයෙක් ප්‍රශ්නයක් ඇසීමට හෝ යෝජනාවක් කිරීමට කැමතිනම් එවැනි ප්‍රශ්නය හෝ යෝජනාව සම්බන්ධ දැන්වීමක් සභාවේ ඉහත රැස්වීම් දිනයක හෝ ඔහු එවැනි ප්‍රශ්නය හෝ යෝජනාව කරන්ට අදහස්කරණ දිනයට ඉතාම අඩුගණනේ දවස් හතරකට ප්‍රථමයෙන් හෝ කළයුතුයි.

6. සෑම සාමාජිකවරුම එවැනි දැන්වීමක් කරණ අතර එම ප්‍රශ්නයේ හෝ යෝජනාවේ පිටපතක් සභාපතිතැනට භාරදිය යුතුයි.

7. සභාව අන්කිසි විධියක නිශ්චයක් කරන්නේනම් මිස නැත්නම් රැස්වීමකදී අසනු ලබණ ප්‍රශ්න සහ කරණුලබන යෝජනා ඒවා දැන්වීම් කරතිබෙණ පිළිවෙළින් කළයුතුයි.

8. ප්‍රතික්ෂෙපකරණලද යම් යෝජනාවක් අඩුගණනේ තුන්මාසයක් ගතවනතුරු නැවත ඉදිරියට ගෙණඒම යුතු නොවේ. තවද රැස්වීමකදී සභාව විසින් පිළිගන්නාලද යෝජනාවකට යම් කිසි විධියකින් විරුද්ධවූ අන්‍ය යෝජනාවක් එම කාලය ඉකුත්වනතුරු භාරගනු නොලැබේ.

9. අයදුම්පතක් හෝ යම් කිසි ලියවිල්ලක් සභාව ඉදිරියට ගෙණෙන සාමාජිකතැන එහි අඩංගු කාරණ ගරුකටයුතු ලෙස තිබීම ගැණ වගකිය යුතුයි. තවද ලිපිකරුගේ නම සහ ස්ථානයත් හරියාකාර සඳහන් නොකළ ලියවිල්ලක් සභාව ඉදිරියෙහි තැබීම තහනම් වේ.

10. අයදුම්පතක් හෝ වෙන ලියවිල්ලක් පිළිගැන්වූකල එහි අදහස කොටින් ප්‍රකාශකළ යුතුයි. තවද ස්ථිරකරණු ලැබූ යම් සාමාජිකයෙකුගේ යෝජනාව පිට එම ලියවිල්ල කියවිය යුතුද නොකියවිය යුතුද යන ප්‍රශ්නය අසනු ලැබේ.

11. සාමාන්‍ය රැස්වීම්වල කටයුතු පහත පෙන්වන පිළිවෙළින් කළයුතුයි:—

(a) පසුගිය සභාවාරයේ වාර්තාව කියවා උවමනානම් වරද හරිගැස්වූවාට පසු ස්ථිරකරණු ලැබීම.
(b) සභාවට එවනලද අයදුම්පත් හෝ වෙනයම් ලියවිලි සභාව ඉදිරියෙහි තබා ඒවා ගැණ නිශ්චයක්කිරීම.
(c) අනිත් කටයුතු මින්පසුවට සඳහන්කරණුලබන පිළිවෙත් පොතෙහි සටහන්කර තිබෙන පිළිවෙළින් සාකච්ඡාකළ යුතුයි.

12. එක එක සභාවාරයේදී සාකච්ඡාකරණු ලැබීමට තිබෙණ කරුණු පිළිවෙළින් ඇතුළත්කර ලකුණුකරණු ලබන්නාවූ පිළිවෙත් පොතක් තැබිය යුතුයි. පසුගිය සභාවාරවලදී සිදුවූදේ එක එක රැස්වීම්වලදී එකී දේ සිදුවූ පිළිවෙළින් ලියාතබන්නාවූ වාර්තා පොතයයි නම්ලත් වෙනින් පොතක්ද තැබිය යුතුයි.

13. සභාව විසින් පත්කරණලද එක එක පරීක්ෂකයා හෝ වැඩවිමසන්නාද පැමිණිලි පොතක් තබා එය සෑම රැස්වීම්වලදීම සභාවට පෙන්විය යුතුයි. තවද සෙනසුරාදා දවස්ද නිවාඩු දවස් සහ සභාව පවත්වන්නේ යම් දිනක නම් ඒ දිනයද එවැනි රැස්වීමකට පෙර දිනයද හැර සුමානයේ අනික් සෑම දිනවලම මෙම පොත පොදුජනයාට බැලියහැකි ආකාර දවල් 11හේ පටන් සවස 4 දක්වා ඔහුගේ කන්තෝරුවෙහි තැබිය යුතුයි. තමන්ගේ නම ගම පරීක්ෂකතැනට හෝ වැඩවිමසන තැනැත්තාට දැනුම්දෙන්නාවූ සෑම නගර වැසියාටම මෙම පොත බැලීමට ඉඩ තිබේ.

2වෙනි පරිච්ඡේදය. [9 E (2) (b) වගන්තිය.] ප්‍රසිද්ධ කර්මාන්ත, වීථි, පාරවල් සහ පාලම් සෑදීම.

1. සභාව විසින් කලින් සූදානම්කරණලද්දවූද, ස්ථිරකරණුලැබුවාවූද ඇස්ටිමේන්තුව පිට ප්‍රසිද්ධ කර්මාන්ත පිණිස යන්නා සියලුම මුදල් වෙන්කළ යුතුයි.

2. සභාපතිතැන විසින් ලියවිල්ලකින් බලය දෙනුලැබූ කෙනෙකුට හෝ කෙනෙකුන්ට උදේ 7 පටන් සවස 5 දක්වා සියලුම උවමනාකරණ මෙහෙකරුවන්, වැඩකරුවන්, වඩුවන්, කරත්ත සහ සතුන්ද වෙනත් උපකරණද සහිතව සභාවට අයිති නගර සීමාතුළ තිබෙන්නාවූ හෝ අදහස්කරණලද යම් වීථියක් අසල හෝ ඊට යාව හෝ තිබෙන්නාවූ ඉඩමකට ඇතුළ්ව එහි යම් වීථියක් සොයාගැනීම, මැනීම, සෑදීම, එහි වැඩකිරීම, විවෘතකිරීම, වෙනස්කිරීම, හැරවීම, අළුත්වැඩියාකිරීම, ශුද්ධකිරීම, දියුණුකිරීමට හෝ වැට බැඳීමටද හෙවත් එහි පිහිටා තිබෙන හෝ යම් විධියකින් ඊට සම්බන්ධවූ යම් පාලමක්, වැටක්, කාණුවක්, හෝ අගලක් ගොඩනැගීම, හෑරීම, අළුත්වැඩියාකිරීම, ශුද්ධකිරීම හෝ දියුණුකිරීමට හෝ මේ අනාඥවට අඩංගු නිත්‍යානුකූල යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීමටද යන මේ කාරණ සිදුකිරීම පිණිස උවමනාවූ සියලුම කෘත්‍යයන් සහ දේවල් කිරීමට බලය තිබේ.

3. දැනට තිබෙන්නාවූ හෝ සාදන්ට අදහස්කරණලද යම් වීථියක් සොයාගැනීම, මැනීම, සෑදීම, එහි වැඩකිරීම, විවෘතකිරීම, වෙනස්කිරීම, හැරවීම, අළුත්වැඩියාකිරීම, ශුද්ධකිරීම, දියුණුකිරීම හෝ එහි වැටබැඳීමද හෙවත් එහි තුළ පිහිටාතිබෙන හෝ යම් විධියකින් ඊට සම්බන්ධවූ යම් පාලමක්, වැටක්, කාණුවක්, හෝ අගලක් ගොඩනැගීම, හෑරීම, අළුත්වැඩියාකිරීම, ශුද්ධකිරීම, හෝ දියුණුකිරීම කරණවිට එවැනි කෘත්‍යයන් කරණ ස්ථානයන්ගෙන් ඉවත්කිරීමට උවමනාකරණ පස් කුණු කසළ හෝ වෙනත් දේවල් සුදුසු කාලයක් තුළදී එයින් ඉවත්කරණ හැටියට ඊට යාව හෝ ඒ අසල තිබෙන ඉඩමකට දැමීමට සභාපතිතැන විසින් ඉහතකීලෙස බලයදෙනු ලැබූ කෙනෙකුට හෝ කෙනෙකුන්ට නිත්‍යානුකූල බලය තිබේ.

4. පැවත එන හෝ අදහස්කරණලද පාරක් හෝ යම් විධියකින් ඒ සම්බන්ධවූ යම් කිසි කෘත්‍යයක් කරණ කාලය තුළදී ඊට යාව තිබෙන ඉඩම හරහා කාලික පාරක් දැමීමට සභාපතිතැන විසින් ලියවිල්ලකින් බලය දෙනුලැබූ කෙනෙකුට බලය තිබේ. එසේදවුවත් එවැනි පාරක් යම් ගොඩනැගිල්ලක් පිහිටා තිබෙන භූමියක් මැදින් හෝ වටකරණලද භූමියක් හෝ කොටුවක් මැදින් නොදැමිය යුතුයි.

2. පාන්පිටි අනන කාමරය ඉතාම අඩුගණනේ පළල අඩි 12ක් සහ දිග අඩි 15කින් සම්පූර්ණවිය යුතුයි. පූරම වාතාශ්‍රය ඇතිවීම පිණිස අඩුගණනේ දෙපැත්තකින්වත් පලල අඩි 7ට අඩුනොවන අවකාශ ස්ථාන පිටතින් ඇතිවිය යුතුයි. පෝරනුවේ දොර පිටි අනන කාමරය කෙලින් නොදැමිය යුතුයි. සෑම පිටි අනන කාමරයකටම උඩුවියනක් (සීලිං) ඇතිවිය යුතුයි.

3. සෑම පාන්ගෙයටම වාතාශ්‍රය සහ ආලෝකය යහපත්සේ තැබිය යුතුයි. සෑම කොටසේම භිත්ති උස අඩි 7කින් අඩු නොව ගඩොල්, ගල් හෝ කබුක්වලින් බැඳිය යුතුයි. එහි ඇතුල හුණෙන් කපරාරුකර හයමාසයකට වරක් සුදුහුනු ගෑයුතුයි. වහලය බොහෝකාලයක් පවතින ද්‍රව්‍යයකින් සෑදිය යුතුයි. සිලිම අවුරුද්දකට හතර සැරයක් බැගින් කපරාරුකර සුදුහුනු ගෑයුතුයි. නැතහොත් එය වාර්නිස්කරපු හෝ තීන්ත ගාහලද ලෑලි ඉතා කිට්ටුවෙන් වද්දවා සෑදීමට පුළුවන. ගෙබිම සෑම තැන්හි සිමෙන්ති දමා සෑහෙන පමණ කාණුවලින් යුක්තවිය යුතුයි. ඇරීමට හැකිවූද ගෙබිමේ ප්‍රමාණයෙන් දහයෙන් පංගුවකට අඩුනොවන සම්පූර්ණ විශාලකමක් ඇතිවූද ජනේල සෑම කාමරයටම තැබිය යුතුයි.

4. පාන් සහ කැවිලි සාදන්ට පාවිච්චිකරණ සියලුම භාජන ඉතාම පිරිසිදුව තිබිය යුතුයි. තවද ඒවා ගෙබිම සුබ කරණවිට ඉවත්කිරීමටද හැකිවිය යුතුයි.

5. අඩුගණනේ පැය විසිහතරකට වරක් බැගින්වත් ගෙබිම පරීක්ෂා සහිතව සූරා අතුගෑම කළයුතුයි. තවද එම කුණුකසල දිය කාන්දු නොවන වසනලද භාජනයකට එම ඇසිල්ලේම දමා දිනපතා පාන් ගෙයින් පිටතට ගෙණයායුතුයි.

6. සෑම පාන්ගෙයම පිරිසිදු අන්දමේ තැබිය යුතුයි. තවද කානු, වැසිකිලි හෝ අනිකුත් කුණු කසලින් නැගෙණ අශුබ වාතයෙන් තොරවිය යුතුයි.

7. කිසිම පාන්ගෙයක් වැසිකිලියකින් හෝ පෝර ගොඩකින් හෝ ඇර තිබෙන කුණු වළකින් අඩි 50ක් ඇතුළත නොතැබිය යුතුයි.

8. පාන් සෑදීමට ඕනෑකරණ දේවල් හැර වෙන කිසිම බඩුවක් හෝ ද්‍රව්‍යයක් පාන්ගෙය තුළ නොතැබිය යුතුයි.

9. මේසවල මුදුන් හොඳකාර මෝරපු කිට්ටුකර වද්දනලද ලෑලිවලින් හෝ අනතුරය රහිත දියකාන්දු නොවන වෙනයම් ද්‍රව්‍යයකින් හෝ සෑදිය යුතුයි. තවද ඒවා දිනපතා සූරා ශුබකළ යුතුයි.

10. කොයිම කාරණයක් හේතුකොටගෙණ කිසිම සතෙක් පාන්ගෙයක තබා නොගත යුතුයි.

11. බෝවෙන රෝගයකින් පෙළෙන්නාවූ හෝ පාන් ගෙයක් භාරකාරයා දැනුවත්ව බෝවෙන රෝගයකින් ලඟදීම පෙළීසිටියාවූ හෝ එවැනි රෝගයකින් පෙළෙන අයෙකුට සාත්තුකිරීමෙහි ලඟදී යෙදී සිටියාවූ කෙනෙකුට පාන්ගෙයට ඇතුල් වීමට හෝ එම පාන් සෑදීමට හෝ එහි අවට විකිණීමට එම පාන්ගෙය භාරකාරයා විසින් නොයෙදිය යුතුයි.

12. පාන් සෑදීමේ හෝ පිලිස්සීමේ යෙදී සිටින සියලුදෙනාම පාන් සෑදීම පටන්ගන්ට පෙර අත් සෝදාගෙණ පපුව සහ ශරීරය වැසෙන අන්දමේ පිරිසිදුවූ සුදු වැස්මක් සහ සුදු කැප් එකක් හෝ තලප්පාවක් ඇන්ද යුතුයි.

13. පාන් විස්කෝත්තු සහ රස කැවිලි සෑදීමෙහි යෙදීසිටින්නන්ගේ පාවිච්චියට හොඳ වතුර සහ සබන් සපයා තැබිය යුතුයි.

14. විකිණීමට තබනුලබන සියලුම පාන් විස්කෝත්තු සහ රසකැවිලි ජාති මැස්සන්ට ඇතුල්වෙන්ට නුපුළුවන් නිසි ලෙස සාදනලද විදුරු පෙට්ටිවල තැබිය යුතුයි. පෙට්ටි ඉතාම පිරිසිදුව තැබිය යුතුයි.

15. පාන් සෑදීමට ගන්නා පිටි වතුර සහ අනිත් ද්‍රව්‍යයන් යහපත් ඒවා විය යුතුයි. තවද බිමෙන් අඩි 3ක් උස්කොට සාදනලද උස් ස්ථානයක පිටි තැබිය යුතුයි.

16. පාන් පුළුස්සන ගෙවල්වලට අයිති මිදුල්වල තිබෙන කසල සියල්ලම දිනපතා ඉවත්කළ යුතුයි. කාණුද හොඳකාර වතුර ගසා සේදිය යුතුයි.

17. පාන්ගෙයි මට්ටමට ඇත්තාවූද එම ගොඩනැගිල්ලේ කොටසක් වන්නාවූද කිසිම ස්ථානයක බිමේ පටන් සීලිම දක්වා පැතිර තිබෙන ක්‍රමයකින් පාන් ගෙයින් හරියාකාර වෙන්කර නැත්නම් එය නිදාගැණීමට පාවිච්චි නොකළ යුතුයි. මුත්‍රා කොටුවක් හෝ වැසිකිළියක් හෝ අලුවලක් පාන්ගෙය ඇතුළේ හෝ ඊට සම්බන්ධකර හෝ නොතැබිය යුතුයි.

18. සෑම සුදුසු වේලාවලටද පාන් පිලිස්සීම කරන්නාවූ ඕනෑම විටකද පාන්ගෙට හෝ පාන් විකිණීමට තබා තිබෙන්නාවූ ස්ථානයට ඇතුල්ව සනීපාරක්ෂක සමිතියේ පරීක්ෂකතැන විසින් හෝ සභාපතිතැන විසින් ලියවිල්ලකින් බලය දෙනලද වෙන කෙණෙකු විසින් හෝ පරීක්ෂාකිරීමට නීතියේ ආකාර බලය තිබේ.

19. මේ අණපණත්වල පිටපතක් රාමුවක දමා සෑම පාන්ගෙවලම හොඳින් පෙනෙන ස්ථානයක එල්ලා තැබිය යුතුයි.

## D.—භෝජන ශාලා, තේ සහ කෝපිකඩ.

1. සියලුම භෝජන ශාලා, තේ සහ කෝපි කඩ සභාපතිතැන සතුටුවන අන්දමේ පිරිසිදුවද සනීපාරක්ෂක විධියටද තැබිය යුතුයි.

2. යම් කිසි භෝජන ශාලාවකට හෝ තේ හෝ කෝපි කඩයකට අයිතිවූ හෝ ඒවායේ පාවිච්චියට ගනු ලබන භාජන, අරුමෝසම් බඩු සහ අනිකුත් උවමනා ද්‍රව්‍යයන් නිරන්තරයෙන්ම පිරිසිදුව තැබිය යුතුයි.

3. සියලුම භෝජන ශාලා සහ තේ හෝ කෝපි කඩවලත් සියලුම භිත්ති කපරාරුකර සුදු හුණු ගෑ යුතුයි. තවද කාමර යහපත්සේ වාතාශ්‍රයෙන් සහ ආලෝකයෙන්ද යුක්තකළ යුතුයි.

4. යම්කිසි භෝජන ශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක මිදුල්වල සහ ඒ අවට තිබෙන සියලුම කුණු සහ කසල දවසකට දෙවරක් බැගින් ඉවත දැමිය යුතුයි.

5. බෝවෙන රෝගයකින් පෙළෙන්නාවූ හෝ භෝජන ශාලාව හෝ තේ හෝ කෝපිකඩය භාරව සිටින තැනැත්තා දැනුවත්ව බෝවෙන රෝගයකින් ලඟදීම පෙළීසිටියාවූ හෝ එවැනි රෝගයකින් පෙළෙන අයෙකුට සාත්තුකිරීමෙහි ලඟදී යෙදී සිටියාවූ කෙනෙකු එවැනි භෝජන ශාලාවේ හෝ තේ හෝ කෝපි කඩේ ඇතුළේ හෝ ඒ අවට වැඩෙහි නොයෙදිය යුතුයි.

6. එවැනි ස්ථානයන්හි පාවිච්චිකරණ සීනි විදුරු මූඩි ගසනලද පළල් කටවල් ඇති බෝතලවල තැබිය යුතුයි.

7. විකිණීමට තබනලද සියලුම කේක්, රසකැවිලි යනාදිය මැස්සන්ගෙන් නිදහස්කොට නිසිලෙස සාදනලද විදුරු පෙට්ටිවල තැබිය යුතුයි. කිසිම කෑම ද්‍රව්‍යයක් මැස්සන් විසින් අපිරිසිදු කරණු ලැබීමට නොහැරිය යුතුයි. පාවිච්චි කරණු ලබන විදුරු පෙට්ටි ඉතා පිරිසිදුව තැබිය යුතුයි.

8. අහකයන තේ, කෝපි හෝ කිරි හෝ කෑංවල ඉතිරි කැබලි, පිසීමේදී අහකයන ද්‍රව්‍යයන් ඊට නිසි භාජනයක එක්කාසුකර දිනපතාම ඉවත්කරණු මිස භූමියෙහි විසිනොකළ යුතුයි.

9. කිසිම භෝජන ශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක නරක කිරි විකිණීම හෝ දීම හෝ විකිණීමට තැබීම හෝ ඒවා එහි ඇතුළත තැබීම හෝ නොකළ යුතුයි.

මේ පණත අනුව නරක කිරියයි කියන්නේ පැමිණෙන්නන්ගේ එවේලේම පාවිච්චිය පිණිස හෝ කෝපි හෝ වෙනත් බීමක් සූදානම්කිරීමට නොව එහි ප්‍රමාණය වැඩිකිරීමට හෝ එහි නිසි ගුණය අඩුකිරීමට අදහස්කර වතුර හෝ රටබීම හෝ වෙන ද්‍රව්‍යයක් මිශ්‍රකරණලද කිරිවේ.

10. මෙම අණපණත් රාමුවක දමා සෑම භෝජන ශාලාවේ හෝ තේ හෝ කෝපි කඩේ හරියාකාර පෙණෙන ස්ථානයක එල්ලා තැබිය යුතුයි.

## E.—මස්කඩ.

1. සියලුම මස්කඩම හොඳකාර වාතාශ්‍රයෙන් සහ ආලෝකයෙනුත් යුක්තකළ යුතුයි. එහි භිත්ති කපරාරුකර අඩුගණනේ අවුරුද්දකට හතර සැරයක් බැගින් ඒවා සුදුහුණු ගෑයුතුයි. තවද ගෙබිම සිමෙන්ති දමා සෑහෙන පමණ කාණු සෑදිය යුතුයි.

2. මස් තබා තිබෙන සියලුම කාමර ඉතා පිරිසිදුව තැබිය යුතුයි.

3. මස්කඩවල පාවිච්චිකරණ සෑම මේසයම සින්ක්තහඩුවලින් හෝ සභාපතිතැන විසින් පිළිගන්නාලද දියකාන්දු නොවන වෙනයම් ද්‍රව්‍යයකින් හෝ වැසිය යුතුයි. එබඳු මේස සහ මස්කපන කොටයද අනිත් උපකරණද ඉතා පිරිසිදුව තැබිය යුතුයි. ඒවා පාවිච්චිකර ඉවරවූ ඇසිල්ලේම වතුරෙන් සෝදා තදවූ හොඳ බුරුසුවකින් මැද්ද යුතුයි. මස් එල්ලා තිබෙන කොකු සියල්ලම හොඳකාර මැද මලකඩ රහිතව තැබිය යුතුයි.

4. අහකයන්නාවූ සහ විකිණිය නොහැකි ද්‍රව්‍යයන්ද ලේකැටි ආදියද වහාම ඉවත්නොකරණු ලැබේනම් ඇතුල සින්ක් තහඩුවලින් වසනලද මැස්සන්ට යාමට නොහැකිවනාකාර සිදුරුවලින් යුක්ත පියනකින් යුක්තවූ පෙට්ටියක දමා තැබියයුතුයි.

5. මස්කඩවල් ඇතුළත සහ එහි අවටත් තිබෙන්නාවූ සියලුම කුණුකසල අඩු ගණනේ දවසකට වරක් බැගින් ඉවත් කළ යුතුයි. තවද කාණු හොඳකාර වතුර ගසා පවිත්‍රකළ යුතුයි.

6. බෝවෙන රෝගයකින් පෙළෙන්නාවූ හෝ යම් මස්කඩයක භාරකාරයා දැනුවත්ව එවැනි රෝගයකින් ලඟදී පෙලී සිටියාවූ හෝ එවැනි රෝගයකින් පෙළෙන රෝගාතුරයෙකුට සාත්තුකිරීමෙහි ලඟදී යෙදී සිටියාවූ කිසිවෙකු කිසි කඩයක් භාර කාරයෙකු විසින් කිසිම මස්පලක වැඩකිරීමට නොයෙදිය යුතුයි.

7. මස් කපන සෑම අයටම අහක යන ද්‍රව්‍යයන් දැමීමට ඔබිනොබ ගෙනයන හැකිවූද ලෝහ ජාතියකින් සාදනලද්දාවූද භාජනයක් සපයාදිය යුතුයි.

8. සෑම මස්කඩවල් සහ එහි ගණුදෙනුකිරීමද, කළමනාකිරීමද සනීපාරක්ෂක සමිතියේ සභාපතිතැන විසින් හෝ සභාපතිතැන විසින් නිසියාකාර අවසර දෙනලද කෙනෙකු විසින් හෝ සෑම වේලේම පරීක්ෂාකරණු ලැබීමට අවකාශ ඇතිසේ තැබිය යුතුයි.

9 මෙම අණපණත් රාමුවක දමා මස්පලේ හොඳකාර පෙණෙන ස්ථානයක තැබිය යුතුයි.

F.—මාලුකඩ.

1. සෑම මාලුපලම හොඳකාර වාතාශ්‍රය සහ ආලෝකයෙනුත් යුක්තකළ යුතුයි. ගෙබිම බාල්දියකට ගලායාමට සෑදූ සිමෙන්තියෙන් සහ ගලින් බඳිනලද කාණුවකට හරියාකාර වැස්මක් ඇතිව සිනිඳු ලෙස දැමූ සිමෙන්තියෙන් යුක්තාවිය යුතුයි. කාණුව සහ බාල්දියත් බෙහෙත් වතුර දමා අඩු ගණනේ දවසකට දෙවරක් බැගින් සේදිය යුතුයි. මාලු විකුණන ස්ථාන ලේබින්දු සහ දූලිවලින් රහිතව නිතරම පවිත්‍රලෙස තැබිය යුතුයි. තවද භිත්ති සහ ගෙබිම අළුත්වැඩියාකළ යුතුයි.

2. යථෝක්ත පණතේ සඳහන්වන කාණුව වෙනුවට සෝදන වතුර බාල්දියට වැටෙනාකාර සකස්කරණලද මධ්‍යයට බෑවුමක් ඇති සින්ක්තහඩුවලින් හෝ ගල් සහ සිමෙන්තිවලින් සෑදූ ලොකු මේසයක් මාලු විකුණන්නා විසින් පාවිච්චිකළ හැකිය.

3. මාලුපලක පාවිච්චියට ගණු ලබන සෑම මේසයම සින්ක්වලින් හෝ සභාපතිතැන විසින් පිළිගන්නාලද දියකාන්දු නොවන වෙනයම් වැස්මකින් වැසිය යුතුය. එබඳු මේස සහ මාලුකපන කොටයද සියලුම උපකරණද ඉතා පවිත්‍රලෙස තැබිය යුතුයි. ඒවා පාවිච්චිකර ඉවරවූ ඇසිල්ලේම වතුරෙන් සෝදා තදවූ පිරිසිදු බුරුසුවකින් මැද්ද යුතුයි. මාලු එල්ලීමට ගන්නා සියලුම කොකු හොඳකාර මැද මලකඩ රහිතව තැබිය යුතුයි.

4. මාලු කූඩා දිනපතාම සෝදා අව්ව සහ වාතාශ්‍රයත් ඇතිවීමට රක්කයක තැබිය යුතුයි. ඒවා මාලු කඩය තුළ නොතැබිය යුතුයි.

5. මාලුපලවල් අයිති සෑම අයම අහක යන ද්‍රව්‍යයක් දැමීම පිණිස ඔබිනොබ ගෙණයතහැකි ලෝහවලින් යොදනලද භාජනයක් සපයාගත යුතුයි.

6. මාලුපලක් ඇතුලේ හෝ එහි අවට තිබෙන්නාවූ සියලුම කුණුකසල අඩු ගණනේ දවසකට වරක් බැගින් ඉවත්කළ යුතුයි. තවද කාණු හොඳකාර වතුර ගසා සේදිය යුතුයි.

7. බෝවෙන රෝගයකින් පෙලෙන්නාවූ හෝ මාලුකඩය භාරකාරයා දැනුවත්ව එවැනි රෝගයකින් ලඟදී පෙලී සිටියාවූ හෝ එවැනි රෝගයකින් පෙලෙන්නාවූ රෝගාතුරයෙකුට සාත්තුකිරීමෙහි ලඟදී යෙදී සිටියාවූ කිසිවෙකු මාලුකඩය භාරකාරයා විසින් එවැනි මාලු කඩයක වැඩෙහි යොදනු ලැබීමට ඇතුළත්කර නොගත යුතුයි.

8. සෑම මාලු විකුණන ස්ථානම කළමනාකරවීම සහ ගණුදෙනුකිරීමත් සභාපතිතැන විසින් හෝ සභාපතිතැන විසින් අවසර දෙනලද වෙන කිසිවෙකු විසින් හෝ සෑම වේලේම පරීක්ෂාකරනු ලැබීමට අවකාශ ඇතිසේ තැබිය යුතුයි.

9. මෙම අණපණත් රාමුවක දමා හොඳකාර පෙණෙන තැනක සෑම මාලුපලේම එල්ලා තැබිය යුතුයි.

G.—ගාල්.

1. බලය දෙනුලැබූ සෑම ගාලම සභාපතිතැන විසින් ලියාපදිංචිකළ යුතුයි. "නොම්මර ———— ලියාපදිංචිකරණලද ගාල" යන වචන සහ අයිතිකාරයාගේ නම පින්තාරුකරණලද දුන්වීම් ලෑල්ලක් බලයලත් තැනැත්තා විසින් එවැනි සෑම ගාලේම ඇතුල්වන ස්ථානයෙහි එල්ලා තැබිය යුතුයි.

2. සෑම ගාල හෝ කරත්ත හෝ ගවයින් නවත්වන ස්ථානයන්හි සභාපතිතැනට සතුටු උපදවන අන්දමේ එක ප්‍රමාණයට මට්ටම්කර නිසියාකාර කාණු දැමිය යුතුයි. බිම මතුපිට තදව මට්ටමට තිබෙනාකාර සිමෙන්තිදමා හෝ ගල්කෑලි අල්ලා හොඳකාර සවිව තැබිය යුතුයි. එවැනි ගාලක හෝ ගවයින් හෙවත් වෙන සතුන් තැබීමට පාවිච්චිකරණුලබන ස්ථානයන්හි තිබෙන සියලුම ගොඩනැගිලි 3වෙනි පණත අනුව තිබීමට සෑදීම සහ තැබීම කළයුතුයි. එවැනි ගාල හෝ නවත්වන ස්ථානය දිනපතා හොඳකාර පවිත්‍ර කරණු ලබන අතරම පිරිසිදුව සහ සනීපාරක්ෂක අන්දමට තබාගත යුතුයි. තවද ගොම සහ කුණුකසලත් මිනිසුන් වාසයකරණ යම්කිසි ගෙවලින් ඈත සභාපතිතැන පිළිගන්නා ස්ථානයකට දවස්පතාම ඉවත්කළ යුතුයි. දිනපතා පවිත්‍රකිරීමට බාධාවන්නාවූ කිසිම බඩුවක් හෝ ලීදඬු ආදියක් හෝ වෙන යම් ද්‍රව්‍යයක් එවැනි ගාලක හෝ නවත්වන ස්ථානයක නොතැබිය යුතුයි.

3. ඉස්තාලයක් හෝ ගවමඩුවක් හෝ ගවයින් නවත්වන ස්ථානයක් හැටියට පාවිච්චිකරණු ලබන සෑම ගොඩනැගිලි හෝ මඩු අයිතිකාරයා හෝ බදුකාරයා හෝ එහි පදිංචිකාරයා සභාපතිතැනට සතුටුදායක වනාකාර සෝදාහරින දේ හෝ මූත්‍රා හෝ වැසි වතුර ගලායාමට නිසියාකාර සිමෙන්ති දමනුලැබූ කාණු සෑදිය යුතුයි. එසේද වුවත් සභාපතිතැනට උවමනායයි කල්පනා වේනම් එම කාණුවලින් යන මූත්‍රා හෝ සෝදා දමන දේවල් සභාපතිතැන විසින් අණකළ පරිදි සාදනලද්දාවූද වැසුවාවූද භාජනයකට හෝ භාජනවලට වැක්කෙරෙණසේ එම කාණු සෑදීමට සභාපතිතැනට අණකරන්ට පුළුවන. ඒවායේ තිබෙන කුණු එම අයිතිකාරයාගේ හෝ බදුකාරයාගේ හෝ පදිංචිකාරයාගේ වියදමින් දිනපතාම ඉවත්කර එයින් කිසිම බාධාවක් නොවන ක්‍රමයකට නැතිකර දැමීමට සැලැස්විය යුතුයි. එවැනි ගොඩනැගිල්ලක බිම සිමෙන්ති හාමු ගඩොල්වලින් හෝ ගලින් හෝ සිමෙන්ති හා කළුගල්වලින් හෝ පහසුවෙන්ම පිරිසිදුව තබාගත හැකි සවිඇති වෙනයම් ද්‍රව්‍යකින් සකස් කොට හොඳකාර අලුත්වැඩියා කරමින් තබාගත යුතුයි. එවැනි ගොඩනැගිල්ලක් සුදුහුණු ගෑහැකි ක්‍රමයට සාදා තිබේ නම් එය හයමාසයකට වරක් හෝ සභාපතිතැන අණකරණ යම් වාරගණනක් එසේ කළ යුතුයි. එසේවුවත් එවැනි ගොඩනැගිල්ලේ හෝ මඩුවේ පටන් වාසයකරණ ගෙයකට ඇති දුර හෝ වෙනයම් කාරණවක් හේතුකොට ගෙණ සභාපතිතැන එවැනි දෙයක් උවමනා නැතැයි සිතානම් යථෝක්ත අණපණත්වලින් ඕනෑම එකක් ගැණ සභාපතිතැනට බුරල දිය හැකිය. වැඩිදුරටත් සභාපතිතැනට උවමනායයි සිතේනම් ඉස්තාලයක්, ගවමඩුවක් හෝ ගවයින් නවත්වන ස්ථානයක් හැටියට පාවිච්චි කරණු ලබන ඕනෑම ගොඩනැගිල්ලක් ගලින්, ගඩොලින් හෝ වෙන පවතින ද්‍රව්‍යයකින් සෑදීමටද උළුසෙවිලි කරණලද හෝ යකඩ වහලක් දැමීමටද අණකිරීමට සභාපතිතැනට පුළුවන.

4. සෑම ඉස්තාලය ගවමඩුව හෝ ගවයින් නවත්වන ස්ථානය දිනපතා හොඳින් පවිත්‍රකර පිරිසිදු සහ සනීපාරක්ෂක අන්දමේ තැබිය යුතුයි. තවද ගොම සහ කුණුකසල වාසයකරණ ගෙවලින් ඈත සභාපතිතැන විසින් පිළිගන්නා ස්ථානයකට දින පතාම ඉවත්කර දැමිය යුතුයි.

5. සෑම ගාලම සභාවේ මූලාදෑනි විසින් හෝ සභාපතිතැන විසින් ලියවිල්ලකින් බලය දෙනලද වෙන කෙනෙකු විසින් ඕනෑවිටක පරීක්ෂාකරණු ලැබීමට අවකාශ දිය යුතුයි.

6. මේ අතුරුපණත් යටතේ සම්පාදනයකිරීම පිණිස සභාපතිතැනට බලයදී තිබෙන සියලුම අණ, ලියවිලිවලින් යුක්තාවිය යුතුයි.

H.—කිරි වෙළඳම්පලවල්.

1. 9E (2) (*d*) යන වගන්තිය යටතේ තිබෙන අතුරුපණත් උදෙසා කිරි වෙළඳම්පල යන්නෙන් කිරි සපයනු ලබන්නාවූද විකිණීම පිණිස කිරි තබා තිබෙන්නාවූද යම්කිසි ගවයින් ඇතිකරණ ස්ථානයක්, ගවයින් ඇතිකරණ ස්ථානයක ඇති

5. අපුල්ලන කෙනෙකුට හෝ ඔහුගේ ගෙයි වැසියෙකුට හෝ යම් කිසි වසංගත නොහොත් බෝවෙන්නාවූ රෝගයක් වැළඳුනිනම් පැය 24ක් ඇතුළතදී ඒ බව සනීපාරක්‍ෂක සමිතියේ සභාපතිතැනට සනීපාරක්‍ෂක පරීක්‍ෂකතැන මගින් හෝ පොලිස් මූලාදෑනියා මගින් හෝ දැනුම්දිය යුතුයි.

6. යම් අපුල්ලන කෙනෙකුට හෝ ඔහුගේ ගෙදර වැසියෙකුට හෝ යම්කිසි වසංගත නොහොත් බෝවෙන රෝගයක් වැළඳුනකල අපුල්ලන ස්ථානයෙහි වැඩ එකෙණෙහිම නැවැත්විය යුතුයි. එබඳු රෝගයක් පටන්ගත් පසුත් පවත්නාතුරුත් සභාපතිතැනගේ විශෙෂ අවසරය පිට මිස අපුල්ලන ස්ථානයට ඇඳුම් ගෙනඒම හෝ එයින් පිටතට ගෙනයාම නොළකයුතුයි.

7. යම් ගෙයක වැසියෙක් බෝවෙන රෝගයකින් පෙළෙන බව විශ්වාසකිරීමට කාරණ තිබේනම් සනීපාරක්‍ෂක සමිතියේ සභාපතිතැනගෙන් හෝ ප්‍රධාන සනීපාරක්‍ෂක මූලාදෑනිතැනගෙන් අවසරය නැතිව එවැනි ගෙයකින් කිලුටු රෙදි ගැනීම කිසිම අපුල්ලන්නෙකු විසින් නොකළයුතුයි.

8. සනීපාරක්‍ෂක සමිතියේ සභාපතිතැන විසින් හෝ ප්‍රධාන සනීපාරක්‍ෂක මූලාදෑනිතැන විසින් හෝ ඔහුගේ උප මූලාදෑනියෙකු විසින් ඕනෑකළකල සෑම අපුල්ලන්නාම ඔහු රෙදි සෝදන අයවලුන්ගේ නාම ලෙඛනයක් දියයුතුයි.

J.—පොදු නවාතැන් ගෙවල්.

1. 9E (2) (d) යන වගන්තිය යටතේ තිබෙන අතුරු අනපණත් උදෙසා පොදු නවාතැන් ගෙවල් යන්නෙන් පවුලේ සාමාජිකයන් නොවන හතරදෙනෙක් හෝ වැඩිගණනක් කුලියට නවත්වාගන්නා ගෙයක් හෝ ගෙයකින් කොටසක් හඟවන්නේය.

2. පොදු නවාතැන් ගෙයක් සම්කොට සාදා හොඳකාර අළුත්වැඩියාකරමින් තබාගත යුතුයි. තවද නිදගන්නා කාමර සභාපතිතැනට සතුටු උපදවන අන්දමට හොඳකාර වාතය ගමන්කිරීමට ඉඩඇතුවද එළිය ඇතුවද තැබිය යුතුයි. තවද එහි බිත්තිවල අවුරුද්දකට තුන්වරක් බැගින් සුදු හුණු ගෑයුතුයි.

3. පොදු නවාතැන් ගෙයක් භාරකාරයා නිතරම ඒ ස්ථානය පවිත්‍රලෙස සහ සනීපාරක්‍ෂක අන්දමටත් තබාගතයුතුයි. කුණු කසල සහ අනතුරු සහිත ද්‍රව්‍යයන් සියල්ලම එම ස්ථානයෙන් ඉවත්කිරීම කරවියයුතුයි.

4. පොදු නවාතැන්පලක සිටින කිසිවෙක් වසංගත නොහොත් බෝවෙන රෝගයකින් ලෙඩවූවිට නවාතැන්පල් කාරයා විසින් හෝ එවැනි අය විසින් හෝ සනීපාරක්‍ෂක පරීක්‍ෂකතැන මගින් හෝ පොලිස් මූලාදෑනියා මගින් හෝ ඒ බව නිසි බලයලත් මූලාදෑනිතැනට වහාම දැන්විය යුතුයි. තවද නවාතැන්පල හැරයාම සඳහා හෝ ඇඳ ඇතිරිලිවලද, ඇඳුම්වලද, අන්‍ය ද්‍රව්‍යවලද රෝග බෝවීමට හේතුවූ දේ විනාශකිරීම සඳහාද ගෙයට දුම් ඇල්ලීම, එහි රෝග බෝවීමට හේතු දේ නැතිකිරීම සහ සුදු හුනු ගෑම සඳහාද නිසි බලයලත් මූලාදෑනියා විසින් කරනු ලබන අණවලට ඔහු කීකරුවිය යුතුයි.

5. සහවාසික අයට සෑහෙන පමණ වැසිකිළි තබාගැනීම සහ ඒවා සනීපාරක්‍ෂක අන්දමට තැබීම ගැණත් පොදු නවාතැන්පල් භාරකාරයා වගකියුතුය.

6. යම්කිසි පොදු නවාතැන්පලක නැවතීමට ඉඩඇති අයවළුන්ගේ ගණන නියමයකිරීමට සනීපාරක්‍ෂක සමිතියේ සභාපතිතැනට මෙයින් බලය දෙනලදී. තවද එබඳු ගණන අවසර පත්‍රයේ සඳහන්කරණු ලැබේ. එබඳු ගණන අධිකවීමට ඉඩ හරින යම්කිසි පොදු නවාතැන්පලක් භාරකාරයෙක් නීති විරෝධි දෙයක්කිරීමේ වරදකාරයෙකු වෙනවා ඇත. මේ අතුරු පණතේ අදහස පිණිස වයස අවුරුදු දොළහෙන් පාත ළමයින් දෙදෙනෙකු එක අයෙකුමෙන් ගණන්ගනු ලැබේ.

7. සනීපාරක්‍ෂක සමිතියේ සභාපතිතැන විසින් හෝ ප්‍රධාන සනීපාරක්‍ෂක මූලාදෑනිතැන විසින් හෝ ඔහුගේ උප මූලාදෑනිතැන විසින් හෝ කොට්ඨාසයේ ප්‍රධාන මූලාදෑනිතැන විසින් හෝ පොදු නවාතැන්පලක් පිහිටා තිබෙන සනීපාරක්‍ෂක නගරයක සෞඛ්‍යය පරීක්‍ෂණයන් කිරීමට සනීපාරක්‍ෂක සමිතියේ සභාපතිතැන විසින් හෝ ප්‍රධාන සනීපාරක්‍ෂක මූලාදෑනිතැන විසින් පත්කරණලද සනීපාරක්‍ෂක පරීක්‍ෂකයෙකු විසින් සෝදිසිකරනුලැබීමට අවකාශඇති අකාර පොදුනවාතැන්පල තැබියයුතුයි.

K.—සෝදන ස්ථාන.

1. කරණලද යෝජනාවකින් යොග්‍යයයි සිතෙන ආකාර කලින් කලට අශ්වයින් සහ ගවයින් සේදීම පිණිස ස්ථාන වෙන්කර තැබීමට සහ ඒවා පාවිච්චිකරණ වේලාවල් නියම කිරීමටද සභාවට ව්‍යවස්ථානුකූලවේ.

2. එයාකාර වෙන්කරනු ලබන ස්ථානවල ලෙඛණයක් ඉංග්‍රිසියෙන්, සිංහලෙන් සහ දෙමළෙන්ද ආණ්ඩුවේ ගැසැට් පත්‍රයේ ප්‍රසිඩකරණු ලැබේ. තවද නගර සීමාතුළ අණබෙර ගැසීමෙන්ද ප්‍රකාශකරණු ලැබේ. තවදයට කියනලද භාෂා තුනෙන්ම ලෙඛණයේ කෙටුම්පතක් කන්තෝරුවේ අලවා තබනු ලැබේ.

3. සමිතිය විසින් මෙසේ වෙන්කරනු ලබන ස්ථානවල හැර වෙන කිසියම් ප්‍රසිඩ ස්ථානයක අශ්වයින්, ගවයින්, රෙදි හෝ පැදුරු සේදීම කිසිවෙකු විසින් නොකළයුතුයි.

4. වසංගත නොහොත් බෝවෙන රෝගයකින් පෙළෙන්නාවූ හෝ ඉහතකී ආකාර වෙන්කර තබනලද සෝදන ස්ථානයක් භාරකාර යම් කිසිවෙක් දැනුවත්ව එබඳු රෝගයකින් ලඟදීම පෙළී සිටියාවූ හෝ එවැනි රෝගයකින් පෙළෙන රෝගාතුරයෙකුට සාත්තුකිරීමෙහි ලඟදී යෙදී සිටියාවූ හෝ කිසිවෙකුට එබඳු සෝදන ස්ථානයක් භාරකාරයෙකු විසින් එබඳු සෝදන ස්ථානයක රෙදි හෝ වෙන ද්‍රව්‍යයක් සේදීමට ඉඩනොදිය යුතුයි.

5වෙනි පරිච්ඡේදය. [9E (2) (i) වගන්තිය.] මුඩුබිම් හෝ පොදු ඉඩම් ප්‍රවේසම්කිරීම.

1. සභාපතිතැනගේ අවසරය නැතුව මුඩුබිමකින් හෝ පොදු ඉඩමකින් වැලි, පස්, ගල් හෝ වැවෙන පැලෑටි, ගස් ගෙණයාමද එවැනි ඉඩමක මතුපිට වෙනස්කිරීම හෝ අවලක්‍ෂණකිරීමද කිසිවෙකු විසින් නොකළයුතුයි.

2. සභාපතිතැනගේ අවසරය නොමැතිව සමිතියට භාරව තිබෙන යම්කිසි පොදු භූමියක, අශ්වයින්ට, ගවයින්ට, එළුබැටළුවන්ට හෝ ඌරන්ට තණ කැවීම හෝ ඔවුන් දිගෙලිකිරීම නොකළයුතුයි. සභාපතිතැනගේ කැමැත්තේ ප්‍රකාර එබඳු අවසරපත්‍රය අවුරුද්දකට හෝ ඊට අඩු කාලයකට දෙනුලැබේ. තවද එය කලින් කලට යෝජනාවකින් සමිතිය විසින් අරමුනුකරනු ලබන ගාස්තු ගෙවීමට යටත්වෙනවා ඇත.

3. නගරය තුල තිබෙන කොයිම් පොදු භූමියක වුවත් යටකී ආකාර අවසර පත්‍රයක් නැතිව දිගේලිකර සිටින්නාවූ හෝ තණ කමින් සිටින්නාවූ අශ්වයින්, ගවයින්, එළුවන්, බැටලුවන්, හෝ වෙන යම් සතුන් ඇල්ලීමට සභාපතිතැන විසින් ඊට බලය දෙනලද කෙණෙකුට පුළුවන්වේ.

4. සභාවට සෑහේයයි කියා සිතෙන නියමයෙන් පිට ප්‍රසිඩ තණභූමි හෝ ඒවායින් කොටසක් අවුරුද්දකින් වැඩි නොවන ඕනෑම කාලයකට බදුදීමට හෝ කුලියට දීමට සභාවට හැකිවේ.

6වෙනි පරිච්ඡේදය. [9E (2) (i) යන වගන්තිය.] මාසිම් දැමීම සහ ඒවා ආරක්‍ෂා කිරීම.

1. නගරයක් තුළ යම් ගෙයක, වත්තක, ගොඩනැගිල්ලක හෝ භූමියක අයිතිකාරයා හෝ පදිංචිකාරයා විසින් එවැනි ගෙය, වත්ත, ගොඩනැගිල්ල හෝ භූමිය බිමෙන් අඩි හතරකට උස අඩුනොවන හොඳ තාප්පයකින් හෝ වැටකින් වට කරණු ලැබිය යුතුයි.

2. ප්‍රසිඩ කානුවකට අඩි 3කින් ඇතුළතින් පැලඳුනි වැටක් මින් ඉදිරියට නොදැමිය යුතුයි.

7වෙනි පරිච්ඡේදය. [9E (2) (k) යන වගන්තිය.] ප්‍රසිඩ නානතැන්.

1. 9E (2) (k) යන වගන්තිය යටතේ තිබෙන මේ පණත් උදෙසා ප්‍රසිඩ නාන තැනක් යන්නෙන් :—මුදල් ගෙවා හෝ නොගෙවා මහජනයා හෝ යම්කිසි විශෙෂ පඩක්තියකට අයත් අයවළුන් නාන යම් ස්ථානයක් හෝ දෙවෙනි පණතේ ප්‍රකාර සනීපාරක්‍ෂක සමිතියේ අණපිට විශෙෂවශයෙන් වෙන්කරණලද යම් ස්ථානයක් හඟවන්නේය.

2. සනීපාරක්‍ෂක සභාවේ බලය පවතින යම් ප්‍රසිඩ ස්ථානයක් හෝ එයින් කොටසක් ප්‍රසිඩ නාන ස්ථානයක් හැටියට පාවිච්චිකරණුලැබීම පිණිස වෙන්කරතැබීමට කරණලද යෝජනාවක මාර්ගයෙන් සමිතියට හැකිවේ. තවද එවැනි ප්‍රසිඩ නාන ස්ථානයක මාසිම් හා සම්බන්ධවනතැන් විස්තාරකිරීමටද සභාවට පුළුවන.

## 15වෙනි පරිච්ඡේදය. ළිං සම්බන්ධ අතිරේක ව්‍යවස්ථා.

1. සනීපාරක්ෂක සභාවක් පිහිටි නගරයක සීමාව තුළ යමෙකු විසින් ළිඳක් කිඳීමට හෝ කිඳවීමට මාසයකට ප්‍රථම එම සභාවේ සභාපතිතැනට නොදන්වා හෝ එම සභාපතිතැනගෙන් ඊට අවසරපත්‍රයක් නොලබා ළිඳක් කැණීම හෝ කැණවීම නොකළ යුතුයි.

2. කක්කුස්සි වළකට, වැසිකිළියකට, ඌරු කොටුවකට, ගාලකට, හරක්මඩුවකට, පෝරගොඩකට, දිය වැස්සෙන අගලකට, අත්හැර තිබෙන කක්කුස්සියකට, දිරායන එළවළු හෝ සත්ව ද්‍රව්‍ය ගොඩකට හෝ පෝර කරණලද ඉඩමකට අඩි 50කින් අඩු දුර ප්‍රමාණයක ළිඳක් කැණවීමට කිසිවෙකුට අවසර නැත.

3. බීමට සහ ගෙදර වැඩට වතුර ගන්නා ළිඳකින් අඩි 50කට අඩු දුර ප්‍රමාණයක කක්කුස්සි වළක්, වැසිකිළියක්, මූත්‍රා කොටුවක්, ඌරු කොටුවක්, ගාලක් හෝ හරක් මඩුවක් යනාදී මෙවා සෑදීමද, පෝර, කුණුවී යන එළවළු සහ සත්ව ද්‍රව්‍ය ආදිය වැලලීම හෝ එක්කාසුකිරීමද, පෝර ජතිදමා ගොවිතැන්කිරීමද, දිය උරාබසින අගලක් තිබෙන්ට හැරීමද තහනම්ය.

4. සියලුම ළිං සිමෙන්ති වැලි ආදී බදාමකින් ජලමට්ටම දක්වා ගඩොලින් බැඳ හෝ යකඩ නල නොහොත් සිමෙන්ති බැම්මකින් නැතහොත් වෙනත් සුදුසු ආකාරයකින් ළිඳතුළ වටේ ආරක්ෂාකොට ළිඳ පතුලෙන් හැර අන්‍ය ස්ථානයකින් වතුර ඉනීමට පුළුවන් අන්දමට නැනිය යුතුයි.

5. වතුර අදින අයවළුන්ට සිටීමට ළිඳ මතුපිට එක පැත්තක ළිංපඩියක් දැමිය යුතුයි. එම පඩිය ළිඳ වටේ සාද තිබෙන මෙහි 6වෙනි වගන්තියේ සඳහන්වන බැම්මට වතුර වැක්කෙරෙන හැටියට එම ළිං පඩියේ ළිං කටේ මැද සිට වතුර පිටට බැස යන අන්දමට හැඩේ ඇතුව එහි ඇතුල් පැත්තේ වතුර කාන්දුනොවෙන ළිං බිත්තියේ කෙරවල් දෙකට පැස්සෙන්ට අඟල් 6ක් උස ඇති ලිස්තරයක් තිබිය යුතුයි. ළිඳේ ඉතුරුහරිය අඩුතරමේ අඩි 2 අඟල් 6ක් උස ඇති තාප්පයකින් වටකිරීම යුතුයි.

6. ළිඳ වටේට පොළව මතුපිට අඩි 5ක් පළලට සහ පිටතට වතුර බැස යන අන්දමට හැඩ ඇතිව ගලින් හෝ ගඩොලින් බැම්මක් බැඳ සිමෙන්ති දැමිය යුතුයි.

7. ළිඳ පිටවටේ බඳින බැම්මේ පිට කෙරවල වටේට සිමෙන්තියෙන් කාණුවක් සෑදිය යුතුයි. ළිඳට කිට්ටුව වතුර නැවතීම වලක්වන පිණිස ඉහතකී කාණුවෙන් වතුර බැස ගලායාමට දිගින් අඩි 10කට අඩු නොවන තවත් දිය අගලක්ද ඇතිවිය යුතුයි.

8. වතුර ඇදීම පිණිස සිටීමට හෝ වෙන කිසි කරුණක් ගැන ළිං කට හරහට ලෑලි නොදැමිය යුතුයි.

9. පිරිසිදු ඇති භාජන ළිංවලට දමා වතුර ගැනීම කටයුතුයි.

10. බීමට හෝ වෙනත් ගෙදර වැඩවලට වතුර ගන්නා ළිඳක ළිං කටේ සිට අඩි 20 කින් අඩු දුර ප්‍රමාණයක රෙදි පිළි සේදීම නොකළ යුතුයි.

11. ප්‍රසිද්ධ නාන ළිං සම්පයේ අයිතිකාරයා විසින් හෝ බදුකාරයා විසින් මිනිසුන් නාන බාල්දි සම්පාදනයකළ යුතුයි. නාමින් සිටින කිසිවෙකු විසින් වතුර ඇදීම තහනම්ය.

12. ගෙඩි හෝ කොළ වැටෙන යම් ගසක් හෝ ගසක අත්තක් ළිඳ කටට ඉහළින් ඇත්තේවිනම්, සනීපාරක්ෂක සභාවේ සභාපතිතැන හෝ සභාවේ අන්‍ය සනීපාරක්ෂක මූලාදෑනියෙක් එහි ගොස් විභාගකරබලා එම කොළ හෝ ගෙඩි වැටීම කරණකොටගෙණ වතුර නරක්වීමට හේතු තිබේයයි එම අයට වැටහීගියේවී නම් එම ගස තිබෙන ඉඩම අයිතිකාරයාට හෝ බදුකාරයාට නොහොත් බාරකාරයාට එම ගස හෝ අත්ත කැප්පවීමට නියමකරණලද දැන්වීමක් යැවියයුතුයි. 14 දවසක් තුළදී එම අය විසින් ඒ අණ පිළිනොපැද්දේවී නම් ඔහු නීතියට විරුද්ධවූ ක්‍රියාවකට වැරදිකාරයෙක්වේ.

13. බීමට හෝ වෙනත් ගෙදර වැඩවලට වතුරගන්නා යම් ළිඳක, වතුර ඉස්සවා සුද්ධකර වෙනත් උවමනා රෙපයේරු වැඩ කළයුතු බව සනීපාරක්ෂක සභාවේ සභාපතිතැනට වැටහේනම් එසේ කිරීමට නියමකරලියනලද ආඥාවක් එම ළිඳ අයිතිකාරයාට හෝ බදුකාරයාට නොහොත් බාරකාරයාට එවියයුතුයි. 14දවසක් තුළදී ඔහු එම අණ පිළිනොපැද්දේවීනම් ඔහු නීතියට විරුද්ධ ක්‍රියාවකට වැරදිකාරයෙක්වේ.

14. යම් විටක සනීපාරක්ෂක සභාවේ යෝජනාවකින් සනීපාරක්ෂාව පිණිස යම් ළිඳක් වැසීමට හෝ බෝවෙන ලෙඩ වැළැක්වීම පිණිස සුද්ධකිරීමට යොග්‍ය බව තීන්දුකරගනීනම් එවැනි ළිඳක් පිහිටි ඉඩම අයිතිකාරයාට නොහොත් බදුකාරයාට හෝ බාරකාරයාට එසේ කිරීමට අණකොට ලියනලද අණපණවක් යැවිය යුතුවා පමණක් නොව එම අණපණවේ ප්‍රකාර 8දවසකින් එම වැඩ කිරීමට අයිතිකාරයා නොහොත් බදුකාරයා හෝ බාරකාරයා බැඳීසිටිත්.

එකී කාලයතුළ ඒ අණපණව පිළිනොපැද්දේනම් ඔහු නීතියට විරුද්ධ ක්‍රියාවකට වැරදිකාරයෙක්වේ.

15. ළිං කැනවීමට අදහස්කරණලද හෝ ලකුණුකරණලද ඉඩම් නොහොත් දැනට තිබෙන වෙනත් ළිං; ළිං පිහිටි ඉඩම් සහ අවට පිහිටි ඉඩම්ද පරීක්ෂාකර බැලීම පිණිස එහි ඇතුල්වීමට සනීපාරක්ෂක සභාවේ කළමනාකාරතැනට හෝ පරීක්ෂකතැනටද එම සභාවේ සභාපතිතැන විසින් ලියවිල්ලකින් බලය දෙනුලැබූ අන් කිසිවෙකුටද බලය තිබේ.

### A.—ලේඛණය. වෙළඳශාලාවලට දෙන අවසර පත්‍ර.

ගාස්තු රුපියල් ———— ගෙය දරණ ———— පදිංචි ————ට අතුරුපණත්වලට යටත්ව ———— වෙළඳශාලාවේ නොම්මර ———— දරණ වෙළඳාම්පල පාවිච්චිකිරීමට අවසර තිබේ.

සනීපාරක්ෂක සභාවේ සභාපතිතැන.

මන්ත්‍රණ සභාප්‍රාප්ත ආණ්ඩුකාරතුමාගේ කැමැත්තට යටත්ව 1914දේ 30වෙනි නීතියේ 5A යන වගන්තියෙන් පවරණලද බලය පිට කළුතර දිස්ත්‍රික්කයේ සනීපාරක්ෂක සමිතිය මෙහි පහත දක්වන ගාස්තු අවසර පත්‍රවලට අයකිරීමට මෙයින් අදහස්කරයි.

| | අවුරුදුපතා ගාස්තු, රු. ශ. |
|---|---|
| පාන් ගෙවල් .. .. .. | 6 |
| භෝජන ශාලා .. .. .. | 6 |
| තේ සහ කෝපි කඩ .. .. | 3 |
| මාළුපලවල් .. .. .. | 6 |
| ගවයින් 10 හෝ ඊට අඩුගණනක් බඳින සෑම ගාල්වලට | 5 |
| සෑම වැඩිපුර ගවයින් 10කට නොහොත් ඊට අඩුගණනකට රු. 5 බැගින් රු. 100 දක්වාද | |
| රෙදි අපුල්ලන ස්ථාන .. .. | 3 |
| පොදු නවාතැන්පලවල් .. .. | 6 |
| පෝර හස්තකර්මාන්ත ශාලාවල් .. .. | 100 |
| ලේ හෝ කැටි ලේ තැම්බීම හෝ වේලීම .. | 100 |
| සම් පදන්කරණ ස්ථාන .. .. | 100 |
| සතුන්ගේ තෙල් උණුකිරීම හෝ ගැනීම .. | 50 |
| සබන් සෑදීම .. .. .. | 50 |

| | අවුරුදුපතා ගාස්තු, රු. ශ. |
|---|---|
| කොහු සායම් පෙවීම .. .. | 2·50 |
| යන්ත්‍ර මගින් වැඩකරන පොල්තෙල් කර්මාන්තශාලා | 100 |
| කොහු හස්තකර්මාන්තය සහ රැස්කිරීම .. | 25 |
| හොන්ඩර 5කට වැඩිව උළුබලකඩ රැස්කිරීම .. | 5 |
| හම්, ඇට, අතින් සාදන පෝර හෝ අතින් සාදන පෝර සෑදීම පිණිස ගන්නා ද්‍රව්‍යයන් ප්‍රමාණයෙන් එක ගෝනියකට වඩා රැස්කර තැබීම .. | 10 |
| කළුගල් හෝ කබුක්වළවල් .. .. | 20 |
| බොරළු වළවල් .. .. .. | 20 |
| ගඩොල් හෝ උළු කර්මාන්තය .. .. | 15 |
| හුනු පෝරන .. .. .. | 12 |
| සිසිල් බීම කර්මාන්ත ශාලා .. .. | 100 |
| ප්‍රසිද්ධ නාන ස්ථාන .. .. | 6 |
| මිනිරන්මඩු හෝ සුද්ධකරණ ස්ථාන .. | 50 |

දැන්වීම.—භෝජන ශාලා, තේ සහ කෝපි කඩ, සාමාන්‍ය නවාතැන්පලවල් සහ ප්‍රසිද්ධ නාන ස්ථානවලටත් ගෙවන ගාස්තු අවුරුදු භාගයකට වතාවක් බැගින් පළමුවෙන් ගෙවන්ට පුළුවන.

H. C. COTTLE, GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.